# තාක්ෂණික ආයතනය

# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව

## හා

# වාර්ෂික ගිණුම්

# 2012

(2014-03-28 දින පැවති 160 වෙනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී.)

# පටුන


| | | |
|---|---|---|
| 1 | දර්ශනය | 1 |
| 2 | කාර්ය ලක්ෂය සහ අරමුණු | 1 |
| 3 | අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | 2 |
| 4 | සංවිධාන සැලැස්ම | 3 |
| 5 | ආයතනයේ නිළධාරීන් | 5 |
| 6 | ආයතනයේ මණ්ඩල | 6 |
| 7 | එන්.ඩී.ටී පාඨමාලාවේ කෙටි ඉතිහාසය සහ තාක්ෂණ ආයතනය පිහිටුවීම | 9 |
| 8 | එන්.ඩී.ටී. වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක් | 10 |
| 9 | විභාග ප්‍රතිඵල සම්පිණ්ඩනය | 13 |
| 10 | අධ්‍යයන අංශවල ක්‍රියාකාරීත්වයන් පිළිබඳ විස්තර | |
| | 10.1 සිවිල් ඉංජිනේරු තාක්ෂණ අංශය | 18 |
| | 10.2 විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු තාක්ෂණ අංශය | 26 |
| | 10.3 යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ සහ මැරිටයිම් අධ්‍යයන අංශය | 35 |
| | 10.4 පොලිමර් රසායනික සහ පේෂකර්ම ඉංජිනේරු තාක්ෂණ අංශය | 46 |
| | 10.5 විෂයාන්තර අධ්‍යයන අංශය | 55 |
| | 10.6 අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර සම්පිණ්ඩනය | 60 |
| 11 | අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තරය | 60 |
| 12 | ඉගෙනීමේ සම්පත් සහ සිසු සහාය | 61 |
| 13 | කාර්මික සම්බන්ධතාවය | |
| | 13.1 කාර්මික පුහුණුව | 63 |
| | 13.2 රැකියාව | 65 |
| | 13.3 ආරාධිත දේශන | 65 |
| | 13.4 කර්මාන්ත චාරිකා | 66 |
| | 13.5 අධ්‍යයන සහ වෘත්තීය ආයතනයක් සමඟ සම්බන්ධීකරණය | 66 |
| 14 | පුනරාවර්තන වියදම් විස්තරය | 66 |
| 15 | මූලධන වියදම් විස්තරය | 66 |
| 16 | ව්‍යාපෘති විස්තරය (දේශිය / විදේශිය අරමුදලින්) | 67 |
| 17 | ව්‍යාපෘති වියදම් විස්තරය (දේශිය / විදේශිය අරමුදලින්) | 67 |
| 18 | මූල්‍යමය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වියදම්) | 67 |
| 19 | මූල්‍යමය ප්‍රගතිය පිළිබඳ විස්තරය (උත්පාදිත අදායම) | 68 |
| 20 | මූල්‍යමය ඵලදායිතා විශ්ලේෂණය | 68 |
| 21 | ලද යටිතල පහසුකම් විස්තරය 2012 | 68 |
| 22 | විගනනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 69 |
| 23 | විගණන කොමිටු වාර්තාව | 73 |
| 24 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 74 |
| 25 | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු | 84 |

## 1 දර්ශනය

තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

## 2 කාර්ය ලක්ෂය සහ අරමුණු

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණික ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදීම.

- සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලගාවිය හැකි, නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම තාක්ෂණික අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.
- නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.
- වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමග ක්‍රියාශීලී සංවාදයක් ඇතිකිරීම.
- තරුණයින්හට සමාජයීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.

### අරමුණු

1. නූතන, පශ්චාත් - ද්විතියික තාක්ෂණික ආයතනයක් සමග අනුකූල වන භෞතික පරිසරයක් ස්ථාපිත කිරීම.
2. සාමජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි මහත්වූ ශිෂ්‍ය ප්‍රජාවට නම්‍යතාවයෙන් ලඟාවිය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රම වේදයක් නිර්මාණය කිරීම.
3. ප්‍රායෝගිකව උචිතවන, පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීම සහ නව්‍යකරණය සහ නිර්මාණශිලිත්වය සඳහා උනන්දු කරවීම.
4. අන්නෝන්‍ය වශයෙන් වාසිදායක ශක්තිමත් වූ හවුල් සබඳතාවයන් ගොඩනැගීම සහ කර්මාන්තයන්හි නියැලීම.
5. සුදුසුකම් ලත් ක්‍රියාශීලි කණ්ඩායමක් වර්ධනය කිරීම.
6. ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම.
7. ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්ත්ව සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම.

## 3 අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීමක්

මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය, ජාතික සහ ජාත්‍යාන්තර වශයෙන් මනා පිළිගැනීමක් ඇති (එන්.ඩී.ටී) අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වගකීමක් සහිත ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතනයකි.

2012 වර්ෂයේ දී ආයතනය ස්වකීය 12 වන වසරට පා තැබීය. භෞතික පහසුකම් නොමැතිවීමෙන් විවිධ අපහසුතාවයන්ට මුහුණ දෙන්නට සිදුවුවද, එසේම මොරටුව විශ්වවිද්‍යාලයේ පවතින පහසුකම් බෙදා වෙන්කරවා ගැනීමට සිදුවීමෙන් එයින් සැහිමකට පත්වන්නට සිදුවුවද, ආයතනය තම ජාතික සේවාව අඛණ්ඩව ඉතා මැනවින් ලබාදීමට සමාලෝචනයට යොමුවන වර්ෂය තුලදී කටයුතු කරන ලදී.

### (ආ) ජයග්‍රහන

අනපේක්ෂිත තත්ත්වයක් හේතුවෙන් සුළු සුළු බාධාවන් ඇති වුවද, ආයතනයේ අධ්‍යයන ක්‍රියාකරකම් අධ්‍යයන කාර්ය සටහනට අනුව ක්‍රියාත්මක විය. සිසුන් 350 ක් ආයතනයේ විෂය ක්ෂේත්‍ර 9කට ඇතුළත් කර ගන්නා ලද අතර එම විෂය ක්ෂේත්‍ර - රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත්, නාවික, යාන්ත්‍රික සහ නාවුක වශයෙන් වේ. නවක සිසුන් සඳහා වූ නම්නීකරණ වැඩ සටහන ඉතා සාර්ථකව ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය කාර්ය සටහනට අනුව සිදුකරන ලදී. තෙවන වසර සිසුන් සඳහා වූ කර්මාන්ත පුහුණු වැඩ සටහන, සැලසුම්කරණ ලද පරිදි ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරියේ සම්බන්ධතාවය ඇතිව ක්‍රියාත්මක කරන ලදී.

සමාලෝචනයට යොමුවන වර්ෂය තුලදී ආයතනය ලද ප්‍රධාන ජයග්‍රහනයක් වුයේ දිගු කලක් තුල බොහෝ සෙයින් අපේක්ෂිතව පැවති යෝජිත මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නව ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව ලද සැලකිය යුතු ප්‍රගතිය වේ. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා චීන ජාතික ගුවන් තාක්ෂණ ආනයන සහ අපනයන සහයෝගිතාවය සමග ගිවිසුමක් අත්සන් කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට බලය පැවරීමේ අනුමැතිය කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදීම අනුව රජය සහ චීන ජාතික ගුවන් තාක්ෂණ ආනයන සහ අපනයන සහයෝගිතාවය සමග ගිවිසුමක් අත්සන් කරන ලද අතර ශ්‍රී ලංකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ව්‍යාපෘති අරමුදල් සම්පාදනය 2012 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදී.

### (ඇ) අසාර්ථකවීම සහ සාධාරණීයකරණය

මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේදී ස්ථාපිත කරන ලද අතර එහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංවර්ධනය වැලැක්වීම සඳහා වූ බොහෝ බාධකවලට මුහුණ දීමට සිදුවිය. සිසුන් ඇතුළත් කිරීම, දශක කිහිපයක් තුල වසරකට 350 කට සිමා වූ අතර 2012 වර්ෂයේ ද එය එසේම පැවතුනි. එයට හේතු වුයේ ප්‍රධාන විශ්වවිද්‍යාලය සමග පවතින පහසුකම් බෙදාගැනීමේ දී පනවන ලද සීමාවන්ය. මේ හේතුව නිසාම සංසෝධිත විෂය මාලාවේ පෙන්වා දී ඇති පරිදි අධ්‍යයන කටයුතු උසස් මට්ටමකින් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම කාර්ය මණ්ඩලයට මෙන්ම සිසුන්ටද අපහසු විය. දිගුකාලීනව පැවති මෙම බාධකයට ක්‍රියාත්මක කල හැකි ඉතාම සුදුසුම ක්‍රියා මාර්ගය වනුයේ, අපේක්ෂිත පරිදි ආයතනය නැවත ස්ථානගත

කොට සංවර්ධනය කිරීමය. මෙම ව්‍යාපෘතියේ භෞතික ක්‍රියාවන් ආරම්භ කිරිමේහි අනපේක්ෂිත ප්‍රමාදයක් ඇතිවුවද අදාල අරමුණ සාධනීය කර ගැනීම සඳහා, ආයතනය නිවැරදි මාවතකට අවතීර්ණ වී ඇත.

### (ඇ) අනාගත සැලැස්ම

ආයතනයේ අනාගත සැලසුම් මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය, නැවත ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ යෝජිත ඉතා වැදගත් සංවර්ධන ව්‍යාපෘතිය සමග බද්ධව පවතී. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සියළුම පාර්ශවයන්ගේ සක්‍රීය දායකත්වය ලැබ, මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව සමග පවත්නා ක්‍රමය තුල ඇති සියළු අවස්ථාවන් උපයෝගීකර ගනිමින්, එහෙත් උසස් තත්ත්වයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමේ ජාතික වගකීම අඛන්ඩව කරගෙන යනු ලැබේ.

## 4 සංවිධාන සැලැස්ම - 2012

රූප සටහන 1 - මොරටුව විශ්වවිද්‍යාලය- තාක්ෂණික ආයතනයේ ඉහල තනතුරු පෙලගැස්ම පෙන්නුම් කරයි.


පාලක සභාව
මොරටුව විශ්වවිද්‍යාලය
කළමණාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ
අධ්‍යයන මණ්ඩලය
නියෝජ්‍ය ලේඛකාධිකාරී
අංශ ප්‍රධාන රසායනික, පොලිමර් සහ පේෂකර්ම ඉංජිනේරු තාක්ෂණ අංශය
අංශ ප්‍රධාන සිවිල් ඉංජිනේරු තාක්ෂණ අංශය
අංශ ප්‍රධාන විදුලි විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණ අංශය
අංශ ප්‍රධාන විෂයාන්තර අධ්‍යයන අංශය
අංශ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ සහ මැරිටයිම් අධ්‍යයන අංශය
සහකාර ලේඛකාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
අධ්‍යයන / අධ්‍යයන සහායක කාර්‍ය මණ්ඩලය
අනධ්‍යයන කාර්ය මණ්ඩලය
මුදල් අංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

## 5 තාක්ෂණික ආයතනයේ නිලධාරීන්

| | |
|---|---|
| අධ්‍යක්ෂ | අචාර්ය ටි.ඒ.පී ගුණසේකර<br><br>Ph.D. – National University of Ireland<br>M.Sc. (First Class Honors) - National University of Ireland<br>M.Eng. – University of Moratuwa<br>NDT (Civil Eng.)<br>MIESL |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී | ඩී.ජේ වික්‍රම මිය (2012.10.21 සිට විශ්‍රාම ගොස් ඇත)<br><br>BA (First Class Honours)- University of Kelaniya<br>Postgraduate Diploma in Management- Open University<br>Diploma in English- University of Colombo |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | එස්.ඒ.එස් ද සිල්වා මෙනවිය<br>B.Com (Special)- University of Colombo<br>PGDBM- University of Colombo<br>ICASLPI<br>MAAT |
| සහකාර ලේඛකාධිකාරී | එස්.ආර්.එස් උදේශී මිය<br><br>B.Sc. Agriculture (2nd Upper Division)- University of Ruhuna.<br>MPhil- Integrated Water Resource Management- University of Peradeniya .<br>Diploma in English for professionals (SLIDA).<br>MBA University of Sri Jayawardanapura (reading). |
| තැපැල් ලිපිනය | තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය<br><br>කටුබැද්ද, ශ්‍රී ලංකාව |
| දුරකථන අංක | පොදු 0112650-301/340/441/534/671<br><br>ෆැක්ස් 0112650-427/622<br><br>අධ්‍යක්ෂ 0112650064<br><br>නියෝජ්‍ය ලේඛකාධිකාරී 0112650870<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී 0112650565 |

## 6 ආයතනයේ කළමනාකරණ මණ්ඩලය

**2012 දෙසැම්බර් මසට, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික හවතුන්**

| | |
|---|---|
| 1. ආචාර්ය ටී.ඒ.ජී ගුණසේකර මහතා | අධ්‍යක්ෂ - තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය |
| 2. ආචාර්ය ඒ.එම්.එන් අලගියවන්න මහතා | ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත |
| 3. ජේ.කේ ලංකාතිලක මහතා | ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත |
| 4. ඒ.ජේ. කරුණාරත්න මහතා | ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත |
| 5. පි.ජී ජයසිංහ මහතා | උසස් අධ්‍යාපන ආමාත්‍යංශ ලේකම්තුමාගේ නාමිත |
| 6. ඒ.ඩබ් සෙනෙවිරත්න මහතා | නාවික විෂයභාර ඇමතිතුමාගේ අමාත්‍යංශ ලේකම්තුමාගේ නාමිත |
| 7. මහාචාර්ය යූ.ජී.ඒ පුස්වැවල | පීඨාධිපති, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය |
| 8. මහාචාර්ය පී.කේ.එස් මහනාම | පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය |
| 9. එල්.ජේ.කේ හෙට්ටිආරච්චි මහතා | මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිත |
| 10. මහාචාර්ය ජේ.ආර්.ලූකස් මහතා | මොරටුව විශ්වවිද්‍යාලයේ සභාතන සභා සාමාජික |
| 11. එම්.එම්.පි.ඩී සමරසේකර මහත්මිය | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජික |
| 12. ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය | මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජික |

**7 2012 දෙසැම්බර් මසට මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජික භවතුන්**

1. ආචාර්ය ටි.ඒ.ජී ගුණසේකර මහතා - අධ්‍යක්ෂ - තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය
2. එම්.එම්.පි.ඩී සමරසේකර මිය
3. කමලා ගමගේ මෙනවිය
4. ජී.ඩී නානායක්කාර මහතා
5. ජී.ජී ජයරත්න මහතා
6. පී.එන්.පී ෆොන්සේකා මිය
7. එම්.වි දසනායක මිය
8. ඒ.එච්.එල්.කේ අමරසේකර මහතා
9. ජී.කේ ජයතුංග මිය
10. ජේ.එම්.පි ගුණසේකර මහතා
11. කේ.එම්.ඩබ් අබේකෝන් මිය
12. එම්.ඒ බිබිලේ මිය
13. කේ.එම් රණසිරි මහතා
14. ඩි.වයි.ටි බඹරවානගේ මිය
15. ජේ.බී සමරසිංහ මිය
16. එස්.සී මතුගම මිය
17. සී.පී.එන් ආටිගල මිය
18. ආචාර්ය අයි.එන් ජයතිලක මිය
19. එස්.එල් ජයසූරිය මිය
20. ජී.ඒ.එම්.ඩී වික්‍රමතිලක මයා
21. කේ. ගලප්පත්ති මෙනවිය
22. එස්. නාගොඩවිතාන මිය
23. එස්.එම් කන්නන්ගර මිය
24. ඩබ්.පී.එස්.කේ පෙරේරා මිය
25. බි.ඒ.එස් ප්‍රියංකා මිය
26. ටී.ආර්.ඩී පෙරේරා මහතා
27. එන්.වි කුලරත්න මිය
28. ආචාර්ය ඩබ්.බි.එම් තෝරදෙණිය මිය

29. කේ.එම්.ඩී සිල්වා මිය
30. එම්.සී.ඩබ් සෝමරත්න මිය
31. එම්.ඩී.එස් සෙනෙවිරත්න මිය
32. ඒ.එම් මුසාතික් මහතා
33. එන්.පී.කේ සේමානන්ද මිය
34. ආර්.සී කොඩිකාර මිය - පුස්තකාලයාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය
35. එම්.අයි.ආර්.ටී ප්‍රනාන්දු මහතා
36. පී.එස් යටපාන මිය
37. ඩබ්.ඒ ඉන්දිරා මිය
38. ඩී.ඒ තේවතාසන් මයා / කර්මාන්ත නියෝජිත
39. ඊ.ජේ.ඒ ජයරත්න මයා / ශිෂ්‍ය නියෝජිත
40. ඩබ්.ජේ.කේ.ඒ.පී බුද්ධික මයා / ශිෂ්‍ය නියෝජිත

## 7 ජාතික තාක්ෂණික පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් සහ මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ (එන්.ඩී.ටී) මුලාරම්භය මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ දී ඇතිවුන අතර එය 1940 ගනන් දක්වා වූ කාලයකට දිව යනු ලැබේ. එහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී.එස්.සී (ඉංජිනේරු) උපාධියට සිසුන් සූදානම් කරන, වර්ෂ හතරක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව කනිෂ්ඨ කාර්මික නිලධාරි දෙවර්ෂ පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී. කනිෂ්ඨ කාර්මික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිළිගැනීමක් ලද මධ්‍යම මට්ටමේ පාඨමාලාවක් වූ අතර මෙම පාඨමාලාව අවසන් කළ අය රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා බොහෝ සෙයින් දායක වූහ.

1960 වර්ෂයේදී මොරටුව, කටුබැද්දෙහි ප්‍රායෝගික තාක්ෂණික ආයතනය පිහිටුවීමත් සමගම කනිෂ්ඨ කාර්මික නිලධාරී (එන්.ඩී.ටී) පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරුකරන ලදී. කැනඩා රජයේ ආධාර ඇතිව (අයි.පී.ටී) පිහිටු වූයේ ප්‍රායෝගික මූලාශ්‍ර සහිත මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම සහ ක්‍රියාත්ම කිරීමටය.

1966 වර්ෂයේ දී ප්‍රායෝගික තාක්ෂණික ආයතනය, ලංකා කාර්මික කොලීජිය ලෙස උසස් කරන ලද අතර පාඨමාලා ව්‍යාප්තියත් සමගම වේගවත් සංවර්ධනයක් ද ඇතිවිය. ලංකා තාක්ෂණික කොලීජිය වර්ෂ පහක කාලයක් සඳහා වූ තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද ජේ.ටී.ඕ පාඨමාලාව සංශෝධනය කොට යාන්ත්‍රික පුහුණුවක්ද ඇතුලත් කොට, එය වසර තුනක ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කරන ලදී. මේ සංවර්ධන ක්‍රියාකාරීත්වයත් සමඟ, ලංකා තාක්ෂණික (සී.සී.ටී) එකම විශ්වවිද්‍යාලය යටතේ වූ, මණ්ඩපයක් බවට 1972 දී උසස් කරන ලදී. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් එන්.ඩී.ටී පාඨමාලාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබීය. 1987 දී එන්.ඩී.ටී පාඨමාලාව, 1978 අංක 16 දරණ පනත අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වූ අතර මෙම පාඨමාලාවට ඇතුලත් වීමේ සුදුසුකම් වූයේ ජී.සී.ඊ උසස් පෙළ සමත්වීමය. මොරටුව විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මකවන (අයි.ටී.යු.එම්) 2000 වසරේ අංක 3 දරණ ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ එන්.ඩී.ටී සහ එයට සමාන්තර පාඨමාලා මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමටය. තාක්ෂණික ආයතනය, කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර, පාඨමාලාවල ස්වාධීන සංශෝධනයන් සඳහා ඉවහල්වන, භෞතික වශයෙන් වෙන්ව පිහිටුවන ලබන ආයතනයක් ලෙස පිහිටුවීමේ, කාර්ය භාරය ඉටුවීම එම මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. ජේ.ටී.ඕ / එන්.ඩී.ටී සම්පූර්ණ කරන ලද අය ජාතියේ සංවර්ධන ක්‍රියාවලියට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දෙති, එන්.ඩී.ටී පාඨමාලාවෙන් පුළුල් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දෙන අතර මධ්‍යම මට්ටමේ කාර්මික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාවන්ද ලබාදෙයි. තවද එය වැඩිදුර ශක්තිමත් පදනමක් ද ඇති කරනු ලැබේ. රටේ පවත්නා මධ්‍යම මට්ටමේ පාඨමාලාවල තත්වය මනින මිනුම් දණ්ඩයක් බවටද මනා පිළිගැනීමක් ලෙස එන්.ඩී.ටී පාඨමාලාව පත්ව ඇත.

## 8 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක්

මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ අප රටෙහි කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රවලට අදාල ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමය. ආයතනය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන, 350 මුළු ශිෂ්‍ය සංඛ්‍යාවකට විෂයධාරා නමයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රසායනික ඉංජිනේරු තාක්ෂණය | 25 |
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 80 |
| විදුලිය ඉංජිනේරු තාක්ෂණය | 40 |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | 40 |
| නාවික ඉංජිනේරු තාක්ෂණය | 15 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | 60 |
| නාවුක අධ්‍යයන තාක්ෂණය | 15 |
| පොලිමර් තාක්ෂණය | 25 |
| පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය | 50 |

මෙයට අමතරව හමුදාවන්ට සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්‍ය මණ්ඩලය සඳහා ශිෂ්‍යයින් පස් දෙනෙක් උපරිම වශයෙන් ඇතුලත් කර ගැනීමට ඉඩ සලස්වනු ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම එයටම ආවේනික වූ ක්‍රියාවලියක් තුලින් සිදුවේ. රජයේ ගැසට් පත්‍රයේ තෝරාගත් ප්‍රතිපත්ති පත්‍ර සහ වෙබ් අඩවිය තුල පළවන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. පසුගිය ජී.සී.ඊ උසස් පෙළ අඛණ්ඩව තෙවරක් පෙනී සිටි සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. ඉසෙඩ් ස්කෝර් දිස්ත්‍රික්ක / විශේෂ කුසලතා වෙන්කිරීම (විශ්වවිද්‍යාල ඇතුළත් කිරිම් මෙන්) සහ විවිධ විෂය ධාරාවන්ට ඇති ඔවුන්ගේ මනාපය පදනම් කරගත් ශිෂ්‍යයින් ඇතුලත් කරගනු ලැබේ.

පරිපූර්ණ ඩිප්ලෝමාධාරියකුගෙන් මූලිකව අපේක්ෂා කරනුයේ වෘත්තිමය ඉංජිනේරුවරයකු හෝ කළමනාකරුවකු සහ ක්ෂේත්‍රය / වැඩපල මට්ටමේ ශ්‍රම බලකාය අතර පවත්නා සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් ඩිප්ලෝමාධාරියාට තමන් වෘත්තීමය ලෙස හැඩගස්වා ගැනීමටත් සම්බන්ධීකරණ සහ කළමනාකරණ කුසලතාවයන් දියුණු කරගැනීමටත් අවශ්‍ය වේ. ඔහු / ඇය තමා තෝරාගත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය. මෙම අවබෝධය තුලින් ඔහු / ඇය වෘත්තීමය ඉංජිනේරුවරයකුගේ නව්‍යකරණය / නිර්මාණ ඇගයීමට හැකිවන අතර තම සහායකයින් සමග අදහස් හුවමාරුකර නව්‍යකරණය / නිර්මාණය යථාර්ථයක් බවට පත්කල හැකිවනු ඇත.

මෙම පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන කටයුතු සඳහා වන අතර එක් අවුරුදු කර්මාන්ත පුහුණුවකින්ද සමන්විතය. පළමු වසරට අදාල විෂයයන් සමාන්තර බව, ස්ථාවරත්වය සහ මූලික විද්‍යාවන් පිළිබඳ ශිෂ්‍යයාගේ දැනුම සහ ඔහු / ඇය තෝරාගනු ලැබූ විශේෂ විෂයධාරා අධ්‍යයනය හඳුන්වා දීම සඳහාය. මෙය ඉංජිනේරු විද්‍යා අභ්‍යාස සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් හෙළිදරව් කරනු ඇත. (උදා: වැඩපොල තාක්ෂණ ඉංජිනේරු සැලසුම්) එක් විෂය ධාරාවක් සඳහා ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල එකක් හෝ ඊට වැඩි ක්ෂේත්‍ර විෂයයක් ලබාදෙනු ඇත. (උදා: සිවිල් ඉංජිනේරු විෂය ධාරාව සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම උගන්වනු ලැබේ.)

පහත සඳහන් කරුණු හේතුවෙන් පළමු වසරේදී ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වේ.

1 ඩිප්ලෝමාධාරියකුගේ වෘත්තීයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. එනිසා සිසුන් තම අවබෝධ කර ගැනීම, කථනය, සහ වාර්තා ලිවීම පිළිබඳ කුසලතාවයන් වැඩි දියුණු කර ගත යුතුය.
2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුළුමුනින්ම ක්‍රියාත්මක කෙරෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. බොහෝ සිසුන් ජී.සී.ඊ උසස් පෙළ දක්වා තමන්ගේ ඉගෙනීම් කටයුතු කර තිබෙන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වන හෙයින් ඒ අයගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය බොහෝ සෙයින් වෙනස් වන අතර දියුණු කර ගැනීමට බොහෝ ඉඩකඩ ඇත.

දෙවන වසරේ විෂයයන් තුල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර තුල විවිධ ඉංජිනේරුමය න්‍යායාත්මක සිද්ධීම්වල නිරතව සිටිමය.

තෙවන වර්ෂය යොදාගෙන ඇත්තේ කර්මාන්තයෙහි නිරතවී ලබන අත්දැකීම් ලබා ගැනීම සඳහාය. පිලිගත් කර්මාන්ත ආයතනයන්හිදී ලබාදෙන පුහුණුව සංවිධානය කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කර්මාන්ත පුහුණුව භාර කථිකාචාර්යවරයා විසිනි.

වසර 3 ක ඉගෙනීමෙන් සහ පුහුණුවීමෙන් අනතුරුව සමත්වන සිසුන් හට විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති කුසලතා නිර්නායක අනුව සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨ වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

ලකුණු අනුව නිරීක්ෂනය කෙරෙන අධ්‍යයනයකදී හෙලිදරව් වී ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබායන අයගෙන් එසේ අධ්‍යයන කටයුතු අවසන් කර වසරක් තුල රැකියා නියුක්ත වීම 100% බව පෙන්නුම් කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අංශයේ දැනට ක්‍රියාත්මක වන නව විෂය කලාව ඉදිරිපත් කරනු ලැබුවේ 2005 වර්ෂයේ දී පළමු වසර සිසුන් සඳහා වන අතර දෙවන වසර සිසුන් සඳහා 2006 වර්ෂයේදී ය. එහි අරමුණ වුයේ, කර්මාන්ත ලෝකයේ වර්තමාන තාක්ෂණ දියුණුව හා සමගාමීවන, සිසුන් තෝරාගත් විෂයධාරාවන්හි ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමය.

**ශිෂ්‍ය ඇතුලත් කිරීම්**

2012-12-31 දිනෙන් අවසන් අධ්‍යයන වර්ෂය සඳහා සිටි ශිෂ්‍ය සංඛ්‍යාව

| | | ප්‍රථම වසර 2011/2012 | දෙවන වසර 2010/2011 | තෙවන වසර 2009/2010 |
|---|---|---|---|---|
| 1 | රසායනික ඉංජිනේරු තාක්ෂණය | 24 | 23 | 18 |
| 2 | සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 83 | 78 | 61 |
| 3 | විදුලිය ඉංජිනේරු තාක්ෂණය | 40 | 40 | 33 |
| 4 | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | 44 | 40 | 35 |
| 5 | නාවික ඉංජිනේරු තාක්ෂණය | 15 | 14 | 17 |
| 6 | යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | 61 | 60 | 44 |
| 7 | නාවුක අධ්‍යයන තාක්ෂණය | 15 | 18 | 18 |
| 8 | පොලිමර් තාක්ෂණය | 22 | 22 | 15 |
| 9 | පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය | 53 | 45 | 31 |
| | **එකතුව** | **357** | **340** | **272** |

2012-08-31 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ජාතික ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේදී ඩිප්ලෝමා ප්‍රදානය කරන ලද (2008/2009 කණ්ඩායම) ශිෂ්‍ය සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1 | රසායනික ඉංජිනේරු තාක්ෂණය | 20 |
| 2 | සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 64 |
| 3 | විදුලිය ඉංජිනේරු තාක්ෂණය | 32 |
| 4 | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | 36 |
| 5 | නාවික ඉංජිනේරු තාක්ෂණය | 25 |
| 6 | යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | 53 |
| 7 | නාවුක අධ්‍යයන තාක්ෂණය | 03 |
| 8 | පොලිමර් තාක්ෂණය | 19 |
| 9 | පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය | 37 |
| | **එකතුව** | **289** |

## තාක්ෂණික ආයතනය- මොරටුව විශ්වවිද්‍යාලය

## 2013 අප්‍රේල් මාසයේ දී පවත්වන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පළමු වසර (2011/2012) පරීක්ෂණය ප්‍රතිඵල සම්පිණ්ඩනය

| ක්ෂේත්‍රය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | අසමත් | අසමත් ර් | ආර් 1 | ආර් 2 | ආර් 3 | ආර් ආර් 1 | ආර් ආර් 2 | ආර් ආර් 3 | සමත් | ර් සමත් | සම්පූර්ණ කළ | සමත් ර් | අසමත් % | සමත් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **රසායනික** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 24 | 01 | - | 01 | 01 | - | - | - | - | 20 | - | - | 01 | 4.17 | 83.33 |
| නැවත පෙනීසිටීම | - | - | - | - | | | - | - | - | - | - | - | - | - | - |
| ඌණ සාමාර්ථය | 15 | - | 01 | - | | | 04 | - | 01 | - | 03 | 06 | - | - | 6.66 |
| **සිවිල්** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 82 | 02 | - | 06 | 02 | 02 | - | - | - | 70 | - | - | - | 2.43 | 85.36 |
| නැවත පෙනීසිටීම | 11 | 02 | 02 | 02 | 02 | - | - | - | - | 03 | - | - | - | 18.18 | 27.27 |
| ඌණ සාමාර්ථය | 36 | - | 01 | - | 01 | - | 09 | 05 | 03 | - | 03 | 14 | - | - | - |
| **විදුලිය** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 40 | 01 | - | 01 | 01 | - | - | - | - | - | 35 | - | 02 | 2.5 | - |
| නැවත පෙනීසිටීම | 07 | 01 | 01 | 02 | - | - | - | - | - | 03 | - | - | - | 14.28 | 42.85 |
| ඌණ සාමාර්ථය | 20 | - | - | - | - | - | 06 | - | - | - | 04 | 10 | - | - | - |
| **විද්‍යුත් සහ විදුලි සන්දේශ** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 43 | - | - | 02 | 02 | - | 01 | - | - | 38 | - | - | - | - | 88.37 |
| නැවත පෙනීසිටීම | 01 | - | - | - | - | - | - | - | - | 01 | - | - | - | - | 100 |
| ඌණ සාමාර්ථය | 13 | - | - | - | - | - | 01 | - | - | 02 | 04 | 06 | - | - | 15 |
| **යාන්ත්‍රික** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *56 | 01 | - | 05 | - | 03 | 01 | - | - | 43 | - | - | 02 | 1.78 | 76.78 |
| නැවත පෙනීසිටීම | 09 | - | 01 | 02 | - | 01 | - | - | - | 03 | - | - | 02 | - | 33.33 |
| ඌණ සාමාර්ථය | 21 | - | - | - | - | - | 08 | - | - | 01 | 08 | 04 | - | - | 4.76 |
| *1අත්හිටුවා ඇත | | | | | | | | | | | | | | | |
| **මුහුදු නාවික** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 15 | - | - | - | - | - | - | - | - | 15 | - | - | - | - | 100 |
| නැවත පෙනීසිටීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඌණ සාමාර්ථය | 07 | - | 01 | - | - | - | 02 | - | - | - | 02 | 02 | - | - | - |

| ක්ෂේත්‍රය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | අසමත් | අසමත් ඊ | ආර් 1 | ආර් 2 | ආර් 3 | ආර් ආර් 1 | ආර් ආර් 2 | ආර් ආර් 3 | සමත් | ඊ සමත් | සම්පූර්ණ කළ | සමත් ඊ | අසමත් % | සමත් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නාවික** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 15 | - | - | - | - | - | - | - | - | 15 | - | - | - | - | 100 |
| නැවත පෙනීසිටීම | 01 | - | - | - | - | - | - | - | - | 01 | - | - | - | - | 100 |
| ඌණ සාමාර්ථය | 02 | - | - | - | - | - | 02 | - | - | - | 03 | 07 | - | - | - |
| **පොලිමර්** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 22 | - | - | - | - | 01 | - | - | - | 21 | - | - | - | - | 95.45 |
| නැවත පෙනීසිටීම | 01 | - | 01 | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඌණ සාමාර්ථය | 07 | - | 01 | - | - | - | 01 | 01 | - | - | 02 | 02 | - | - | - |
| **පේෂකර්ම** | | | | | | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 50 | 01 | 01 | 02 | - | - | - | - | - | 45 | - | - | 01 | 2 | 90 |
| නැවත පෙනීසිටීම | 08 | 03 | 03 | - | - | 01 | - | - | - | 01 | - | - | - | 37.5 | 12.5 |
| ඌණ සාමාර්ථය | 21 | - | - | - | - | - | 06 | 02 | - | - | 04 | 09 | - | - | - |
| **එකතුව** | 471 | 12 | 15 | 23 | 09 | 08 | 41 | 08 | 04 | 282 | 68 | 60 | 08 | | |

| | | |
|---|---|---|
| අසමත් | - | අසමත් වූ |
| අසමත් ඊ | - | ඉංග්‍රීසි සහිත අසමත් |
| ආර් | - | ඌණ සාමාර්ථ |
| ආර් ආර් | - | නැවත ඌණ සාමාර්ථ |
| සමත් | - | පළමු වසර පරීක්ෂණය සමත් |
| ඊ-සමත් | - | ඉංග්‍රීසි සමත් |
| සම්පූර්ණ කිරීම | - | පලමු වසර පරීක්ෂණය සම්පූර්ණ කිරීම |
| සමත් - ඊ | - | ඉංග්‍රීසි හැර පළමු වසර පරීක්ෂණය සමත් |
| ඊ-අසමත් | - | ඉංග්‍රීසි අසමත් |

## තාක්ෂණික ආයතනය- මොරටුව විශ්වවිද්‍යාලය

## 2013 ජූනි මාසයේ දී පවත්වන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා දෙවන වසර (2010/2011) පරීක්ෂණය ප්‍රතිඵල සම්පිණ්ඩනය

| ක්ෂේත්‍ර | ඉල්ලුම් කළ සංඛ්‍යාව | අසමත් | සාර් 1 | සාර් 2 | සාර් සාර් 1 | සාර් සාර් 2 | සමත් | සම්පූර්ණ කළ සංඛ්‍යාව | අසමත් % | සමත් % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **රසායනික** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *23 | 01 | 02 | 02 | - | - | 17 | - | 4.34 | 73.91 |
| නැවත පෙනීසිටීම | 02 | 02 | - | - | - | - | - | - | 100 | - |
| ඌණ සාමාර්ථය | 04 | - | - | - | 01 | 01 | - | 02 | - | - |
| *1 අසම්පූර්ණ | | | | | | | | | | |
| **සිවිල්** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *78 | 13 | 14 | 05 | - | - | 45 | - | 16.66 | 57.69 |
| නැවත පෙනීසිටීම | 29 | 13 | 01 | 02 | - | - | 13 | - | 44.82 | 44.82 |
| ඌණ සාමාර්ථය | 20 | - | - | - | 07 | 02 | - | 11 | - | - |
| *1 අවලංගු | | | | | | | | | | |
| **විදුලිය** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *40 | 04 | 03 | 01 | - | - | 30 | - | 10 | 75 |
| නැවත පෙනීසිටීම | 01 | - | 01 | - | - | - | - | - | - | - |
| ඌණ සාමාර්ථය | 04 | - | - | - | 01 | - | - | 03 | - | - |
| * 2 අසම්පූර්ණ | | | | | | | | | | |
| **විද්‍යුත් සහ විදුලි සංදේශ** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *40 | 02 | 02 | 02 | - | - | 33 | - | 5 | 82.5 |
| නැවත පෙනීසිටීම | 03 | 01 | - | - | - | - | 02 | - | 33.33 | 66.67 |
| ඌණ සාමාර්ථය | 09 | - | - | - | 03 | - | - | 06 | - | - |
| *1 අසම්පූර්ණ | | | | | | | | | | |
| **යාන්ත්‍රික** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 70 | 11 | 12 | 03 | - | - | 44 | - | 15.71 | 62.85 |
| නැවත පෙනීසිටීම | 10 | 02 | 02 | 01 | - | - | 05 | - | 20 | 50 |
| ඌණ සාමාර්ථය | 18 | - | - | - | 4 | - | - | 14 | - | - |
| **මුහුදු නාවික** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 14 | - | - | - | - | - | 14 | - | - | 100 |
| නැවත පෙනීසිටීම | 02 | 01 | - | - | - | - | 01 | - | 50 | 50 |
| ඌණ සාමාර්ථය | 04 | - | - | - | - | 01 | - | 03 | - | - |
| **නාවික** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 18 | 03 | - | - | - | - | 15 | - | 16.66 | 83.33 |
| නැවත පෙනීසිටීම | 03 | - | - | - | - | - | 03 | - | - | 100 |
| ඌණ සාමාර්ථය | 03 | - | - | - | - | - | - | 03 | - | - |
| **පොලිමර්** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | *22 | 03 | 05 | - | - | - | 13 | - | 13.63 | 59.09 |
| නැවත පෙනීසිටීම | - | - | - | - | - | - | - | - | - | - |
| ඌණ සාමාර්ථය | 02 | - | - | - | - | 01 | - | 01 | - | - |
| *1 අසම්පූර්ණ | | | | | | | | | | |
| **පේෂකර්ම** | | | | | | | | | | |
| මුල් පෙනීසිටීම | 45 | 08 | 05 | - | - | - | 32 | - | 17.77 | 71.11 |
| නැවත පෙනීසිටීම | 12 | 06 | 03 | - | - | - | 03 | - | 50 | 25 |
| ඌණ සාමාර්ථය | 07 | - | - | - | 03 | - | - | 04 | - | - |
| එකතුව | 483 | 70 | 50 | 16 | 19 | 05 | 270 | 47 | - | - |

| | | |
|---|---|---|
| අසමත් | - | දෙවන වසර පරීක්ෂණය අසමත් |
| ආර් 1 | - | ඌණ සාමාර්ථය එක් විෂයකින් |
| ආර් 2 | - | ඌණ සාමාර්ථය විෂයන් දෙකකින් |
| ආර් ආර් 1 | - | නැවත ඌණ සාමාර්ථයක් එක් විෂයකින් |
| ආර් ආර් 2 | - | නැවත ඌණ සාමාර්ථය විෂයයන් දෙකකින් |
| සමත් | - | දෙවන වසර පරීක්ෂණය සමත් |
| සම්පූර්ණ කල | - | දෙවන වසර පරීක්ෂණය සම්පූර්ණ කිරීම |

## සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර සම්පීන්ඩනය

| අධ්‍යයන අංශ | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| **සිවිල් ඉංජිනේරු තාක්ෂණය** | පලමු වසර | 79 | ස්ථිර 05 | 01 |
| | දෙවන වසර | 79 | කොන්ත්‍රාත් 02 | |
| | තෙවන වසර | 74 | තාවකාලික 03 | |
| | | | බාහිර 07 | |
| **යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවික අධ්‍යයනය** | <u>යාන්ත්‍රික</u> | | ස්ථිර 09 | 01 |
| | පලමු වසර | 59 | | |
| | දෙවන වසර | 53 | බාහිර | |
| | තෙවන වසර | 60 | කථිකාචාර්ය 08 | |
| | <u>නාවික</u> | | | |
| | පලමු වසර | 14 | බාහිර උපදේශක 16 | |
| | දෙවන වසර | 19 | | |
| | තෙවන වසර | 20 | බාහිර ව්‍යාපෘති | |
| | <u>නාවුක</u> | | නිලධාරි 02 | |
| | පලමු වසර | 13 | | |
| | දෙවන වසර | 17 | කොන්ත්‍රාත් | |
| | තෙවන වසර | 19 | පදනම මත 05 | |
| **පොලිමර්, පේෂකර්ම සහ රසායන ඉංජිනේරු තාක්ෂණය** | <u>පොලිමර්</u> | | | තාවකාලික 01 |
| | පලමු වසර | 22 | ස්ථිර 11 | |
| | දෙවන වසර | 23 | | |
| | තෙවන වසර | 17 | බාහිර | |
| | <u>පේෂකර්ම</u> | | කථිකාචාර්ය 10 | |
| | පලමු වසර | 53 | | |
| | දෙවන වසර | 47 | තාවකාලික | |
| | තෙවන වසර | 44 | උපදේශක 04 | |
| | <u>රසායන</u> | | | |
| | පලමු වසර | 24 | | |
| | දෙවන වසර | 24 | | |
| | තෙවන වසර | 23 | | |
| **විදුලිය, ඉලේට්‍රොනික, සහ විදුලි ස දේශ ඉංජිනේරු තාක්ෂණය** | <u>විදුලි ඉලෙක්ට්‍රොනික</u> | | ස්ථිර 14 | තාවකාලික 01 |
| | පලමු වසර | 84 | තාවකාලික | |
| | දෙවන වසර | 80 | බාහිර | |
| | තෙවන වසර | 85 | උපදේශක 21 | |
| **විෂයාන්තර අධ්‍යයන** | පලමු වසර | 350 | ස්ථිර 07 | තාවකාලික 01 |
| | දෙවන වසර | 350 | තාවකාලික 04 | |
| | තෙවන වසර | - | බාහිර 02 | |

# 10 අධ්‍යයන අංශ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ විස්තර

## 10.1 සිවිල් ඉංජිනේරු තාක්ෂණ අංශය

### 1. හැඳින්වීම

මෙම අධ්‍යයන අංශය සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සම්බන්ධ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව පිළිගන්වන අතර, ගොඩනැගිලි ඉදිකිරීම්. ජල සැපයුම්, වාරිමාර්ග සහ මහමාර්ග යන විවිධ සිවිල් ඉංජිනේරු තාක්ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳව සිසුන් පුහුණු කරනු ලැබේ. කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා ඉටුකිරීමට යොමු කෙරෙන ඩිප්ලෝමාධාරීන්, කර්මාන්ත ක්ෂේත්‍රවල මධ්‍යම මට්ටමේ තාක්ෂණික කළමනාකරුවන් ලෙස සේවය කරමින්, ඉංජිනේරුවන් සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ අනෙක් ශ්‍රම බලකායන් අතර බැඳීමක් ඇති කරන සම්බන්ධතාවයන් බඳු වන්නේය.

මෙම අධ්‍යයන අංශය, 2012 වර්ෂයේ පළමු සහ දෙවන වසර වැඩ සටහන සම්බන්ධව සඳහන් කර ඇති වැඩ ප්‍රමානයද ඇතුළුව පහත සඳහන් වැඩ සටහනෙහි 1 සහ 2 අනුව විෂයයන් උගන්වනු ලැබේ.

සටහන 1 - පළමු වසර

| සංකේත අංකය | විෂයය | එල් | ටී | පී | පාඨමාලා |
|---|---|---|---|---|---|
| ඩී.සී.ඊ 101 | ගොඩනැගිලි ඉදිකිරීම් සහ සැලසුම් ශිල්පය | 2 | | 3 | CI |
| ඩී.සී.ඊ 102 | ඉංජිනේරු යාන්ත්‍රික විද්‍යාව සහ ද්‍රව්‍ය බලය (ද්‍රව්‍ය කොටස් හි බලය පමණි) | 1 | 1/2 | 1 | සියළුම පාඨමාලා |
| ඩී.එම්.ඊ 101 | ව්‍යවහාරික තාප ගති විද්‍යාව සහ ද්‍රව යාන්ත්‍රික විද්‍යාව (ද්‍රව යාන්ත්‍රික විද්‍යා කොටස පමණි) | 1 | 1/2 | 1 | පේෂකර්ම සහ නාවුක හැර සියළුම පාඨමාලා |

සටහන 2 - දෙවන වසර

| සංකේත අංකය | විෂයය | එල් | ටී | පී | පාඨමාලා |
|---|---|---|---|---|---|
| ඩී.සී.ඊ 201 | ගොඩනැගිලි ඉදිකිරීම් | 2 | - | 3 | සිවිල් ඉංජිනේරු විද්‍යා පමණි |
| ඩී.සී.ඊ 202 | සිවිල් ඉංජිනේරු තාක්ෂණයෙහි කර්මාන්ත කළමනාකරණය | 2 | - | - | |
| ඩී.සී.ඊ 203 | මහාමාර්ග ඉදිකිරීම් හා නඩත්තු කිරීම් | 2 | 1 | - | |
| ඩී.සී.ඊ 204 | වාරිමාර්ග ඉංජිනේරු විද්‍යා | 2 | 1 | - | |
| ඩී.සී.ඊ 205 | ප්‍රමාණ සමීක්ෂණය | 2 | 1 | - | |
| ඩී.සී.ඊ 206 | ද්‍රව්‍ය බලය, ද්‍රාව බලය, සහ පස පිළිබඳ යාන්ත්‍රික විද්‍යාව | 2 | - | 2 | |
| ඩී.සී.ඊ 207 | මිණුම් සහ මිණුම් තලමිතිය | 2 | - | 6 | |
| ඩී.සී.ඊ 208 | න්‍යාය සහ ව්‍යුහයන් නිර්මාණය | 2 | 3 | 3 | |
| ඩී.සී.ඊ 209 | ජලය සහ අප ජලය ඉංජිනේරු විද්‍යාව | 2 | 1 | - | |

**සටහන :** එල් - සතියකට නියමිත දේශන පැය සංඛ්‍යාව
ටී - සතියකට නියමිත නිබන්ධන පැය සංඛ්‍යාව
පී - සතියකට නියමිත ප්‍රායෝගික / ක්ෂේත්‍ර සංඛ්‍යාව / සැසඳුම් පැය සංඛ්‍යාව

## 2 පරිපාලනය

2012 වර්ෂයේ සිවිල් ඉංජිනේරු තාක්ෂණ අංශයේ අංශ ප්‍රධානියා ලෙස ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය මිය ඇයගේ අංශ ප්‍රධාන සේවා කාලය ඉදිරියට ගෙන යමින් කටයුතු කරන ලද අතර එම්.ඩී නිරෝෂා මහත්මිය (පරිගණක යෙදවුම් සහකාර) අංශයේ පරිපාලන කටයුතු වලට සහාය ලබාදුනි.

අධ්‍යයන අංශ කොමිටුව 2012 වර්ෂය තුළ දී දෙවරක් රැස්වුනි. මෙම කොමිටුව අංශයේ සියළුම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සහ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියෝජිතයින් වන **ඉංජිනේරු යූ.සී පතිරනගේ මහතා** සහකාර සමාන්‍යාධිකාරී (සැලසුම් හා නිර්මාණ) ජාතික ජල සම්පාදන හ ජලපවහන මණ්ඩලය සහ **පූජිත උඩුවන මහතා,** කළමනාකරණ අධ්‍යක්ෂ සචින්ද්‍ර එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම, යන දෙදෙනාගෙන් සමන්විතය. සියළුම තාවකාලික කාර්‍ය මණ්ඩලයට සහ බාහිර කථිකාචාර්යවරුන්ට අරාධිතයන් ලෙස සහභාගි වන ලෙස ආරාධනා කොට ඇත.

කථිකාචාර්යවරුන් සහ ඊට ඉහළ මට්ටමේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලයේ සමාජිකයින් ලෙස සේවය කරමින් පරිපාලන කටයුතුවලට දායකත්වය ලබාදුනි. ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය මහත්මිය සහ එම්.පී.පී.ඩී සමරසේකර මහත්මිය කළමනාකරණ මණ්ඩලයේ සමාජිකාවක් ලෙස කටයුතු කරමින් පරිපාලනයට ස්වකීය දායකත්වය ලබාදුනි. සියළුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දේශන පැවැත්වීමට සහ අදාළ පරීක්ෂණ මණ්ඩල වලට පරීක්ෂකවරු සහ ප්‍රමිතකරුවන් ලෙස සේවය කිරීමට පත් කරනු ලද්දෝ වූහ.

## 3 අධ්‍යයන ක්‍රියාකාරකම්

2007 වර්ෂයේ දී අංශයේ අධ්‍යයන කාර්‍ය මණ්ඩලය සඳහා තනතුරු 12 ක් අනුමත වුනි. ඉංජිනේරු ඉගැන්වීම් සහයකවරුන් දෙදෙනෙක් විශ්‍රාම යෑම සහ ඉල්ලා අස්වීම හේතුවෙන් මතු සඳහන් සංඛ්‍යාව 10 දක්වා අඩුවිය. මෙසේ අඩුවී ඇති තනතුරු වෙනුවට නව තනතුරු ඇති කරන ලෙස බලධාරීන් දැනුවත් කර ඇත. එහෙත් 2012 වර්ෂයේ දී අංශයට සේවය ලැබුනේ අධ්‍යයන කාර්‍ය මණ්ඩල සාමාජිකයින් 6 දෙනෙකුගෙන් පමණි. එසේ වුවත් වර්ෂය තුල තිදෙනෙක් විශ්‍රාම ගත් හෙයින් වර්ෂය අවසාන වනවිට අධ්‍යයන අංශයේ සේවය සඳහා සිටියේ අධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථිර සේවකයින් 03 දෙනෙකු පමණි. ඉතිරි අධ්‍යයන ක්‍රියාකාරකම් ඉටුවූයේ කොන්ත්‍රාත් පදනම මත, තාවකාලික සහ බාහිර කාර්‍ය මණ්ඩලයෙනි. අංක 4.1 සහ 4.2 ඡේද වල දැක්වෙන පරිදි තාවකාලික සහ බාහිර කාර්‍ය මණ්ඩලයෙන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය සමන්විත විය.

සුදුසුකම්ලත් කායයී මණ්ඩලයේ හිඟය පැවතුනද, සියළුම ප්‍රධාන අධ්‍යයන වගකීම් ඉටුකර ගැනීමට අධ්‍යයන අංශයට හැකිවිය. විශේෂයෙන් අධ්‍යයනය සහ සම්බන්ධ කටයුතු වලදී ඉතිරි කායයී මණ්ඩලයට මෙය බොහෝ අසීරු තත්ත්වයක් විය.

### 3.1 2012 වර්ෂයේ දී අධ්‍යයන අංශයේ සිසුන් සංඛ්‍යාව

**සටහන 3 - අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව**

| පැවැත්වූ පාඨමාලාව | පළමු වසර | දෙවන වසර |
|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 79 | 79 |

### 3.2 ක්ෂේත්‍ර චාරිකා

දෙවන වසර සිසුන්හට ස්වකීය න්‍යායාත්මක දැනුම වර්ධනය කර ගැනීමට ක්ෂේත්‍ර චාරිකා 03 ක් සංවිධානය කිරීමට අංශයට හැකිවිය.

### 3.3 මිණුම් කඳවුර

අධ්‍යයන අංශයේ පාලනයෙන් තොර ආචාර්ය භවතුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් හේතුවෙන් 2012 අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන කටයුතු නිශ්චිත කාල සීමාව තුල නිමකිරීමට නොහැකි වීමෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා දෙවන වසර සිසුන් සඳහා පවත්වන වාර්ෂික මිණුම් කඳවුර නොපැවැත්විනි.

### 3.4 ජයග්‍රහන

අධ්‍යයන අංශය මුහුණදුන් අපහසුතා මධ්‍යයේ වුවද වාර්ෂික සිවිල් ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව බිහිකිරීම අඛණ්ඩව සිදු කෙරිනි.

### 3.5 අභියෝග

මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂතුමාගේ නිත්‍ය විෂය වන සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් පිළිබඳ කාර්මික කළමනාකරණය විෂයට අමතරව " ජලය සහ අපජලය කළමනාකරණය" විෂය අඛණ්ඩව ඉගැන්වීම් සම්බන්ධයෙන් එතුමාට අංශයේ කෘතඥතාවය පිරිනැමේ. ප්‍රමාණ සමීක්ෂණ ගොඩනැගිලි ඉදිකිරීම්, සහ සැලසුම් ශිල්පය (දෙවන වසර) සහ ද්‍රව්‍ය බලය (දෙවන වසර) යන විෂයයන් බාහිර කථිකාචාර්යවරුන් විසින් ක්‍රියාත්මක කරන ලදී.

ඉතා වැදගත් වූ සමහර ප්‍රායෝගික පන්ති සම්බන්ධිකරණය කිරීමේ වගකීම දැරීම කරන ලද්දේ මනා පලපුරුද්දක් ඇති තාවකාලික උපදේශකවරුන් විසිනි. මේ අයගේ සේවය සඳහා වූ අංශයේ කෘතඥතාවය සනිටුහන් කරන අතර පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හදිසි අවශ්‍යතාවයද සඳහන් කළ යුතුය.

## 4 අධ්‍යයන කායයී මණ්ඩලය

අදාල වර්ෂය තුල අධ්‍යයන කායයී මණ්ඩල සාමාජිකයන් තිදෙනෙක් ඉල්ලා අස්වූ අතර එක් කායයී මණ්ඩල සාමාජිකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

- ඩබ්.ඒ ඉන්දිරා මහත්මිය (ආධුනික කථිකාචාර්ය) 2012-03-31 දින සිට සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

- අචාර්ය අයි.එන් ජයතිලක මහත්මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය III ශ්‍රේණිය තනතුරෙන් 2012-07-24 දින ඉල්ලා අස්විය.

- එන්.පි.කේ සේමානන්ද මහත්මිය (ආධුනික) කථිකාචාර්ය තනතුරෙන් 2012-09-30 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

- කේ.ඒ.බී වීරසිංහ මහතා (කොන්ත්‍රාත් පදනම මත) කථිකාචාර්යවරයෙක් ලෙස අධ්‍යයන අංශයට බඳවා ගැනිනි.

## 4.1 ස්ථිර කාර්‍ය මණ්ඩලය

අධ්‍යයන කාර්‍ය මණ්ඩල ලැයිස්තුව, අධ්‍යයන අංශය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම, තාක්ෂණික ආයතනයට, විශ්වවිද්‍යාලයට සහ බාහිර ආයතනවලට ලබාදෙන දායකත්වය, 4 වන සටහනේ සඳහන් වේ.

## 4.2 බාහිර කථිකාචාර්යවරු සහ තාවකාලික කාර්‍ය මණ්ඩලය සහ කොන්ත්‍රාත් කාර්‍ය මණ්ඩලය

**බාහිර කථිකාචාර්යවරු**

**(1) ඩී.ඒ තේවතාසන් මයා**

**සුදුසුකම් - JTO-Civil**

ගොඩනැගිලි ඉදිකිරීම් සහ සැලසුම් ශිල්පය (පළමු වසර) විෂයයන් පිළිබඳ කාර්යභාර කථිකාචාර්ය ගොඩනැගිලි ඉදිකිරීම් (දෙවන වසර)

**(2) ජී.ඩබ්.ටී.සී කණ්ඩම්බි මිය - 2012 ඔක්තෝබර් 15 දින සිට**

**සුදුසුකම් - M. Phil Degree, C. Eng**

ප්‍රමාණ සමීක්ෂණ පිළිබඳ කාර්‍යභාර කථිකාචාර්ය (දෙවන වසර)
ගොඩනැගිලි ඉදිකිරීම්

**(3) ආර්.ඩී සිරිසේන මයා - 2012 ජුනි මස 5 දින දක්වා පමණි**

**සුදුසුකම් - NDT – Civil, MIIESL**

ප්‍රමාණ සමීක්ෂණ විෂයභාර කථිකාචාර්ය (දෙවන වසර)

**(4)** **කේ. යූ අමරසේකර මයා**

**සුදුසුකම් - JTO – Civil, AMIE-Struct. Eng**

නිබන්ධන පන්ති න්‍යාය සහ ව්‍යූහ නිර්මාන (දෙවන වසර)
ද්‍රව්‍ය බලය විෂය කථිකාචාර්ය

**(5)** **ආර්. කරුණාසේන මයා - ඉංජිනේරු විද්‍යාපති (මොරටුව)**

**සුදුසුකම් - AMIESL, NDT (Civil Eng) (H.S.T.I. Amparei)**

ජල විද්‍යාව සහ ද්‍රව යාන්ත්‍රික විද්‍යාව (පළමු වසර)

**තාවකාලික උපදේශකවරු**

(1) ඩබ්.එස් ජයතුංග මිය - 2012-07-31 දින ඉල්ලා අස්විය.

(2) හර්ෂා ගලබොඩ මිය - ජලය සහ අපජලය ඉංජිනේරු විද්‍යා නිබන්ධන සහ ප්‍රායෝගික පන්ති සම්බන්ධීකාරක (දෙවන වසර) සහ ද්‍රව යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික පන්ති (පළමු වසර).

(3) එච්.කේ.වයි බුද්ධික මහතා - මිණුම් සහ මිණුම් තලමිතිය පිළිබඳ ප්‍රායෝගික පන්ති පිළිබඳ සම්බන්ධීකාරක (දෙවන වසර)

**උපදේශකවරු (කොන්ත්‍රාත් පදනම මත)**

(1) එච්.සි.අයි.ඒ පෙරේරා - “ද්‍රව්‍යවල ශක්ති” සහ “ද්‍රව යාන්ත්‍රික විද්‍යාව” පිළිබඳ පළමු වසර නිබන්ධන පවත්වන ලදී.

4.3 **සම්මන්ත්‍රන / වැඩමුළු ආදියෙහි කාර්‍ය මණ්ඩල සහභාගිත්වය**

(1) ආචාර්ය ටී.ඒ.ජී ගුණසේකර ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය මිය සහ එම්.එම්.පී.ඩී සමරසේකර මිය “ ධරණිය මට්ටමේ වර්ධනය සඳහා ජාතික ඵලදායිතාව උපරිම කිරීම” මැයෙන් වූ සම්මන්ත්‍රණය, වෘත්තිකයන්ගේ සංවිධාන මගින් ස්වකීය තාක්ෂණික සැසිවාරය සඳහා සංවිධානය කරන ලද්දකි. 2012 ඔකතෝබර් 9 දින.

(2) අචාර්ය ඩබ්.බි.එම් තෝරදෙණිය මිය “ ඵලදායිතා වර්ධනය සඳහා අත්දැකීම්” පිළිබඳ එක් දින වැඩ සටහන. 2012 නොවැම්බර් 02 දින කම්කරු අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වන ලදී.

(3) ආචාර්ය ඩබ්.බි.එම් තෝරදෙණිය මිය ජලය පිළිබඳ තරුණ වෘත්තිකයන්ගේ සම්භාෂණය - 2012 නොවැම්බර් 22 සහ 23 දිනයන්හිදී ලංකා ජලනී (ජාතික ජල හවුල්කරු) විසින් සංවිධානය කරන ලදී.

## 5 වෙනත් ක්‍රියාකාරකම්

(1) අධ්‍යයන අංශයට පරිගණකයක් සහ වයිට් බෝඩ් එකක් මිලදී ගන්නා ලදී.

(2) "ව්‍යාපාරික ආචාර ධර්ම" පිළිබඳ ආරාධිත දේශනයන් එන්.ඩී.ටී සියළුම දෙවන වර්ෂ සිසුන් සඳහා අධ්‍යයන අංශ ප්‍රධානි විසින් සංවිධානය කරන ලදී. මෙහි අරාධිත දේශකයා වුයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂනයේ හිටපු ජොෂ්ඨ සහකාරතුමිය වන ඩෙල්රින් බොයිඩ් මහත්මිය විය. මෙම දේශනයට සවන්දීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනයේ බොහෝ සිසුන් සහ අචාර්ය මණ්ඩල සාමාජික භවතුන් පැමිණ සිටියහ. මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ සිසුන්හට දේශනයේ ඇති ප්‍රයෝජන සඳහා සහ එම දෙසුම පිළිබඳ ඉතා ඉහලම ප්‍රසංසාවක් ලැබුනි.

## 6 පයෝෂණ

**1 ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය මිය**

(ඒ) ගොඩනැගිලි ව්‍යාපෘතිවල සැලසුම් අදියර කළමනාකරණය

(බි) ජල සැපයුම් ක්‍රම පිළිබඳ අනුව සිතා බැලීම

**2 කේ.එන්.බී වීරසිංහ මහතා**

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය පිළිබඳ විදේශිය කොන්ත්‍රාත්කරුවන්ගේ බලපෑම.

## 7 ප්‍රකාශන

1 තෝරදෙණිය බද්රානි, මලිත් රණසිංහ සහ එන්.ටී.එස් විජේසේකර (2012) " ධරණීය ජල සම්පත් වල වර්ධනය සඳහා සම්බන්ධතාවය සඳහා තීරණ පහසු කිරීමේ උපකරණය" ඉංජිනේරු, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයන්ගේ ආයතනයේ සගරාව, වෙලුම 45 2012 ඔක්තෝබර් 4.

2 වීරක්කොඩි වයි.ඩී.සී සහ තෝරදෙණිය ඩබ්.බී.එම් (2012) ගොඩනැගිලි ව්‍යාපෘතිවල අරමුණු සාර්ථකව ශාක්සාත් කර ගැනීම සඳහා සැලසුම් මට්ටමෙහි කළමනාකරණය - ශ්‍රී ලාංකීය දෘෂ්ටියකි. සි.අයි.ඕ.බී ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රනය 2012 ජුනි 28-30 කොළඹ ශ්‍රී ලංකාව.

3 වීරසිංහ කේ.ඒ.බී සහ ඒකනායක එල්.එල් - "විදේශිය කොන්ත්‍රාත් හරහා ලැබෙන තාක්ෂණ හුවමාරුව, හැකියාවන් සහ දුෂ්කරතාවයන්" ධරණීය සංවර්ධනය සඳහා සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අභ්‍යාසයන්හි වර්ධනයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - ඉංජිනේරු විද්‍යා පියය, රුහුණු විශ්වවිද්‍යාලය, ගාල්ල ශ්‍රී ලංකාව 2012 මාර්තු.

4 ද සිල්වා පී.සී.පී බණ්ඩාර ආර්.එම්.පි.එන්.එස් සහ වීරසිංහ කේ.ඒ.බී "නගරාන්තර ගමනාගමනය සඳහා වන ඉල්ලුම ඇස්තමේන්තු කිරීම සඳහා වන සමීක්ෂණය මොරටුව නාගරික ප්‍රදේශය තුල සිද්ධි අධ්‍යයනකි" 21 වන සියවසේ පර්යේෂනයන්හි විවිධාකාරවූ ස්වභාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.

සටහන 4 අධ්‍යයන කාය්‍ය මණ්ඩලය

| අංකය | වර්ගය | නම සහ සුදුසුකම් | අංශයට ඇති වගකීම් | විශ්වවිද්‍යාලයට / තාක්ෂණික ආයතනයට දායකත්වය | බාහිර ආයතනවලට දායකත්වය |
|---|---|---|---|---|---|
| 01 | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය** | **ආචාර්ය ටී.ජී.ජී ගුණසේකර**<br>• ආචාර්ය උපාධිය - ජාතික විශ්වවිද්‍යාලය, අයර්ලන්තය<br>• එම්.එස්.සී (ගෞරව පළමු පෙළ) ජාතික විශ්වවිද්‍යාලය, අයර්ලන්තය.<br>• එම්. ඉංජිනේරු විද්‍යා, මොරටුව.<br>• ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු විද්‍යා)<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජික.<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සම්මාන සාමාජික | • LIC DCE 202, DCE 209 | • මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂකතුමා. | • තෘතිය තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ ජාතික අධ්‍යාපන කොමිසමේ ස්ථාවර කොමිටු සමාජික. |
| 02 | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය** | **ආචාර්ය ඩබ්.බී.එම් තෝරදෙණිය මිය**<br>• ආචාර්ය උපාධිය (මොරටුව)<br>• එම්.ෆිල් (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)<br>• එම්.එස්.සී (විශිෂ්ඨ සාමාර්ථය) (නෙදර්ලන්තය)<br>• පශ්චාත් උපාධි ඩිප්ලෝමා (මොරටුව)<br>• එන්.ඩී.ටී (සිවිල් ඉංජිනේරු)<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සංගමයේ සාමාජික | • LIC DCE 204 | • අංශ ප්‍රධාන සිවිල් ඉංජිනේරු අංශය<br>• සාමාජික - කළමනාකරණ මණ්ඩලය<br>• ශිෂ්‍ය විනය කටයුතු පිළිබඳ HOD සම්බන්ධිකාරක | • කාර්මික අධ්‍යාපනය සහ පුහුණු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ<br>• පාලක සභා සාමාජික, ඒකාබද්ධ ඉංජිනේරුවරුන්ගේ ආයතනය - ශ්‍රී ලංකාව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය** | **ආචාර්ය අයි.එන්. ජයතිලක මිය**<br>• පී.එච්.ඩී (ව්‍යුහ ඉංජිනේරු විද්‍යා) (මොරටුව)<br>• එම්. ඉංජිනේරු (ද්‍රව බලය ඉංජිනේරු) (මොරටුව)<br>• බි.එස්.සී ඉංජිනේරු (මොරටුව) | • LIC DCE 208 | | |
| 04 | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය** | **එම්.එම්.පී.ඩී සමරසේකර මිය**<br>• දර්ශනපති (මොරටුව)<br>• එම්. ඉංජිනේරු විද්‍යා (පාරිසරික ඉංජිනේරු විද්‍යා සහ කළමනාකරණය, මොරටුව)<br>• බී.එස්.සී (ඉංජිනේරු විද්‍යා) (මොරටුව) | • LIC DCE 203, DCE 206 (පස යාන්ත්‍රික විද්‍යාව කොටසක්)<br>• ප්‍රායෝගික පන්ති සම්බන්ධීකාරක DCE 206, DCE 102 කොටස | • සාමාජික කළමනාකරණ මණ්ඩලය<br>• සාමාජික - ව්‍යාපෘති කොමිටුව, තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාල ස්ථායිගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | |
| 05 | **කථිකාචාර්ය (ආධුනික)** | **එන්.පී.කේ සේමානන්ද මිය**<br>• එම්.එස්.සී (දකුණු ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලය)<br>• එන්.ඩී.ටී | • LIC DCE 101 | | |
| 06 | **කථිකාචාර්ය (කොන්ත්‍රාත්)** | **කේ.ඒ.බී වීරසිංහ මයා**<br>• බි.එස්.සී (ඉංජිනේරු) (මොරටුව) | • LIC DCE 207 | | |

සටහන - LIC - කාර්යභාර කථිකාචාර්ය

## 10.2 විදුලිය, විද්‍යුත් සහ විදුලි ස දේශ සහ ඉංජිනේරු තාක්ෂණ අංශය

### 1 හැඳින්වීම

වැඩ සටහන් දෙකක් යටතේ මෙම අංශය ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබාදෙයි. (එන්.ඩී.ටී) එනම් විදුලිය ඉංජිනේරු තාක්ෂණය, සහ විද්‍යුත් සහ විදුලි ස දේශ ඉංජිනේරු තාක්ෂණයයි.

මෙම වැඩසටහන් දෙක තුලින් ශිෂ්‍යයන්ට ඉංජිනේරු තාක්ෂණ ක්ෂේත්‍ර තුනක එනම් විදුලිය, විද්‍යුතය, සහ විදුලි සන්දේශ, පුහුණුව ලබාදෙන අතර එම පුහුණුව කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලනු ලබයි. කර්මාන්ත ක්ෂේත්‍රයන්හි මධ්‍යම මට්ටමේ නිලධාරින් ලෙස ක්‍රියා කරමින් මෙම ඩිප්ලෝමාධාරීන් ඉංජිනේරුවරුන්ගේ සහ කර්මාන්තයෙහි අනෙක් සියළු ශ්‍රම බලකායන් අතර පවතින බැඳීමක් ලෙස ඉතාවැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පළමු වසර සහ දෙවන වසර වැඩසටහන් සඳහා අධ්‍යයන අංශය විසින් පහත සඳහන් විෂයයන් උගන්වන ලදී.

**පළමු වසර**

| සංකේත අංකය | විෂයය | එල් | ටී | පී | පාඨමාලා |
|---|---|---|---|---|---|
| ඩී.ඊ.ඊ 101 | ඉලෙක්ට්‍රෝ තාක්ෂණය | 2 | 1 | 2 | CH, Civil, ME, NT, Text…. |
| ඩී.ඊ.එන් 101 | ඉලෙක්ට්‍රොනික | 2 | 1 | 2 | EE, EN,MR |
| ඩී.ඊ.ඊ 102 | විදුලිය සහ විදුලියට අදාල මැනීම් මූලධර්ම | 2 | 1 | 2 | EE, EN,MR |

**දෙවන වසර**

| සංකේත අංකය | විෂයය | එල් | ටී | පී | පාඨමාලා |
|---|---|---|---|---|---|
| ඩී.ඊ.ඊ 202 | විදුලිය යන්ත්‍ර | 2 | 1 | 3 | EE |
| ඩී.ඊ.ඊ 204 | බලය පාලනය සහ ඉලෙක්ට්‍රොනික | 2 | 1 | 3 | EE |
| ඩී.ඊ.ඊ 205 | බල පද්ධතිය | 2 | 1 | 3 | EE, |
| ඩී.ඊ.ඊ 206 | රූප සටහන් අනුව රැහැන් ඇදීම සහ විදුලිය ඉදිකිරීම් | 2 | 1 | 3 | EE,EN |
| ඩී.ඊ.එන් 202 | විද්‍යුතය සහ විදුලි ස දේශ | 2 | 1 | 3 | EE |
| ඩී.ඊ.එන් 203 | කර්මාන්ත ඉලෙක්ට්‍රොනික සහ මිණුම් | 2 | 1 | 3 | EE,EN |
| ඩී.අයි.එස් 202 | ගණිතය | 2 | 1 | 3 | EE,EN |
| ඩී.එම්.ඊ 204 | කර්මාන්ත කළමනාකරණය | 2 | 1 | 3 | EE,EN |
| ඩී.එම්.ඊ 208 | ජල ශක්ති බලය දියරමය යන්ත්‍ර | 2 | 1 | 3 | EE |
| ඩී.ඊ.එන් 201 | ඉලෙක්ට්‍රොනික | 2 | 1 | 3 | EN |
| ඩී.ඊ.ඊ 203 | විදුලිය යන්ත්‍ර සහ බල පද්ධතිය | 2 | 1 | 3 | EN |
| ඩී.ඊ.එන් 205 | විදුලි සන්දේශ 1 | 2 | 1 | 3 | EN |
| ඩී.ඊ.එන් 206 | විදුලි සන්දේශ 11 | 2 | 1 | 3 | EN |
| ඩී.ඊ.එන් 204 | මයික්‍රො සැකසුම් පද්ධතිය | 2 | 1 | 3 | EN |

## 2 පරිපාලනය

බි.ඒ.එස් ප්‍රියංකා මහත්මිය විදුලිය, විද්‍යුත් සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශ ප්‍රධානියා ලෙස ඇයගේ සේවය අඛණ්ඩව කරගෙන යන ලදී. ඩබ්.එම්.වී.එල් වාස් මෙනවිය පරිගණක යෙදවුම් සහකාරිනිය ලෙස අංශයේ පරිපාලන සේවා කටයුතුවලට සහයෝගය ලබාදුනි.

2012 වර්ෂය තුල අධ්‍යයන අංශ කොමිටුව එක්වරක් රැස්වී ඇත. මෙම අධ්‍යයන අංශ කොමිටුව සියළුම ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සහ කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරන දෙදෙනෙකුගෙන් සමන්විතය. සියළුම තාවකාලික සහ බාහිර කථිකාචාර්යවරුන්ට අරාධිතයන් ලෙස සහභාගිවීමට ආරාධනා කර ඇත.

කථිකාචාර්ය ශ්‍රේණියේ සිට ඉහළ මට්ටමේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පරිපාලනයට දායකත්වය ලබාදෙන ලදි. දේශන භාරව කටයුතු කරන සියළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අදාල පරීක්ෂණ මණ්ඩලවල සේවය කරන ලදී.

## 3 අධ්‍යයන කටයුතු

2008 වර්ෂය සඳහා අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට තනතුරු 12 ක් අනුමත වී තිබුනි. එසේ වුවද 2012 වර්ෂය තුලදී අංශයට සේවය ලැබුනේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් 8 දෙනෙකුගේ පමණි. ඉතිරි අධ්‍යයන කටයුතු කෙරුනේ තාවකාලික හා බාහිර කාර්ය මණ්ඩලයෙනි. ඡේද 3.4 යටතේ ලැයිස්තු ගතකර ඇති පරිදි, අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථිර තාවකාලික සහ බාහිර කාර්ය මණ්ඩලයෙන් සමන්විතය.

මොරටු විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනය නිල වශයෙන් සැකසුනාට පසුව මෙම අංශයේ ප්‍රධානතම පසුගාමී තත්වයන් ඇතිවුයේ සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් වැනි සම්පත්වල ඇති තදබල හිඟය හේතුවෙනි.

### 3.1 2012 වර්ෂයේ අධ්‍යයන අංශයේ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව

| පැවැත්වූ පාඨමාලාව | පළමු වසර | දෙවන වසර |
|---|---|---|
| විදුලි ඉංජිනේරු තාක්ෂණය | 40 | 40 |
| විද්‍යුතය / විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | 44 | 40 |

### 3.2 ජයග්‍රහන

### 3.3 අභියෝග

එන්.ඩී.ටි ඩිප්ලෝමාධාරින්ගේ ඉල්ලුම සැපයුමට වඩා ඉහළ මට්ටමක වැඩි සංඛ්‍යාවක් විය. එන්.ඩී.ටි විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු විද්‍යා හදාරණ සිසුන් තමන්ගේ යන්ත්‍ර භාවිතා පුහුණු කාලය තුලදීම රැකියාවලට යොමුවන බව හෙලිවී ඇත. මෙම තත්ත්වය විදුලිය සහ ඉලෙක්ට්‍රොනික විෂය ධාරාවන්

සඳහා අතිරේක සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට පූර්ව නිගමනයකට එලඹිය හැකි වන්නේය. තවද සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක සහ යටිතල පහසුකම් සංවර්ධනයට ඇති අවශ්‍යතාවය පැහැදිලිව පෙනේ.

### 3.4 අධ්‍යයන කාර්ය මණ්ඩල (ස්ථිර) ක්‍රියාකාරකම්

(1) එස්.එම් කන්නන්ගර මිය 2012 වර්ෂය තුල පූර්ණ කාලීනව පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැලී සිටියාය.

(2) ඩී.වයි.ටී බඹරවානගේ මිය 2012 ඔක්තෝබර් මස ඇයගේ පූර්ණකාලීනව පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැලී සිටියාය.

**කථිකාචාර්ය**

**01. බී.ඒ.එස් ප්‍රිය කා මහත්මිය බී.එස්.සී (සාමාන්‍ය), එම්.එස්.සී (මොරටුව)**

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

- 2010.09.01 සිට විදුලිය, ඉලෙක්ට්‍රොනික, සහ විදුලි ස දේශ ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශයේ අංශාධිපති ලෙස සේවය කරයි.
- අධ්‍යයන මණ්ඩල සහ පරීක්ෂණ මණ්ඩලයේ සේවය කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටු, නිවාඩු සහ ප්‍රදාන කොමිටියෙහි සේවය කිරීම
- ඩී.ඊ.ඊ 101 (ඉලෙක්ට්‍රො තාක්ෂණය), ඩී.ඊ.ඊ 102 (විදුලිය මිණුම් සහ ඉලෙක්ට්‍රොනික) පිළිබඳ දේශන, අභ්‍යාස සහ ප්‍රායෝගික පන්ති පැවැත්වීම.
- INCO ප්‍රදර්ශනය පිළිබඳ සංවිධාන කොමිටුවෙහි සේවය කිරීම.
- එන්.ඩී.ටී සමාරම්භක වැඩසටහන සංවිධාන කොමිටුවෙහි සේවය කිරීම.

**බාහිර ආයතන**

- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු කිරිමේ අධිකාරිය විසින් සම්පාදනය කරන ලද යන්ත්‍ර සූත්‍ර පුහුණු ඇගයීම් මණ්ඩලවල සේවය කිරීම.
- ධීවර හා නාවුක ඉංජිනේරු ජාතික ආයතනයේ භෞතික විද්‍යාව දේශන පැවැත්වීම.

**02. එස්.එම් කන්නන්ගර මහත්මිය බී.එස්.සී (විශේෂ ගෞරව) භෞතික විද්‍යා**

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

- ඩී.ඊ.එන් 201 (කර්මාන්ත ඉලෙක්ට්‍රොනික සහ මිණුම්)
- ඩී.ඊ.ඊ 101, ඩී.ඊ.එන් 101 සහ ඩී.ඊ.එන් 201 සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික පරීක්ෂණාගාරයේ ප්‍රායෝගික පන්ති පැවැත්වීම.
- පරීක්ෂණ මණ්ඩලයෙහි සේවය කිරීම.
- 2011-12-01 දින සිට අධ්‍යයන නිවාඩු ලබා සිටී.

බාහිර ආයතන

- ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරිය විසින් සම්පාදනය කරන ලද යන්ත්‍ර සූත්‍ර පුහුණු ඇගයීම් මණ්ඩලයේ සේවය කිරීම.

**කාර්‍යයී මණ්ඩල සංවර්ධනය**

- මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ අධ්‍යයන අංශයෙහි දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වුනි.
- එච්.ඊ.ටී.සී විසින් පවත්වන ලද පයෙයීෂණ හැකියාවන් පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.
- කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවැත්වුනු ආසියා පැසිපික් උසස් අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

| | | |
|---|---|---|
| 03. | **ඩී.වයි.ටී බඹරවානගේ මහත්මිය** | **බී.එස්.සී ඉංජිනේරු, එම් ඉංජිනේරු සාමාජික විදුලි ඉංජිනේරු ආයතනය සහාය සමාජික - ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සංගමය.** |

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

- ඩී.ඊ.ඊ 205 (විදුලිබල පද්ධති) ඩී.ඊ.ඊ 203 (විදුලි යන්ත්‍ර සහ විදුලි බල පද්ධති) පිළිබඳ දේශන සහ ප්‍රායෝගික පන්ති පැවැත්වීම.
- ඩී.ඊ.ඊ 203 (විදුලිය යන්ත්‍ර සහ විදුලි බල පද්ධති) සහ ඩී.ඊ.ඊ 205 (විදුලි බල පද්ධති) දෙවන වසර සිසුන් සඳහා යන්ත්‍ර විද්‍යාගාරයේදී සහ විදුලි බලපද්ධති විද්‍යාගාරයේදී ප්‍රායෝගික පන්ති පැවැත්වීම.
- ඩී.ඊ.එන් 102 ඩී.ඊ.ඊ 102 (විදුලිය මිණුම් සහ ඉලෙක්ට්‍රොනික) ඩී.ඊ.ඊ 101 (විදුලිය පිළිබඳ ප්‍රතිපත්ති) සහ ඩී.එන්.එස් 106 (ඉලෙක්ට්‍රොනික) පළමු වසරේ සිසුන් හට ඉලෙක්ට්‍රොනික විද්‍යාගාරයේදී ප්‍රායෝගික පන්ති පැවැත්වීම.
- ඩී.ඊ.ඊ 203, ඩී.ඊ.ඊ 205( නව නිර්දේශය) දෙවන වසර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සහ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම.
- අධ්‍යයන මණ්ඩලයෙහි සහ පරීක්ෂණ මණ්ඩලයෙහි සේවය කිරීම.

බාහිර ආයතන

- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් සංවිධානය කරන ලද යන්ත්‍ර සූත්‍ර පුහුණු අගැයීම් මණ්ඩලවල සේවය කිරීම.
- ශිෂ්‍ය උපදේශකවරියක් ලෙස සේවය කිරීම.
- ශිෂ්‍ය ගැටුම් සම්බන්ධ පරීක්ෂණ කිහිපයක මණ්ඩල කිහිපයක සාමාජිකයන් ලෙස කටයුතු කිරීම.

**කායයී මණ්ඩල සංවර්ධනය**

- නුගේගොඩ, නාවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ජොෂ්ඨ කායයී මණ්ඩල සංවර්ධනය වැඩසටහන හැදෑරීම
- විදුලි ඉංජිනේරු අධ්‍යයන අංශයේ දර්ශනපති උපාධිය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීම.

**කථිකාචාර්ය (ආධුනික)**

**04. එම්.ඒ බිබිලේ මිය බී.එස්.සී (විශේෂ) එම්.එස්.සී (වෙස්ට්මිනිස්ටර් - එක්සත් රාජධානිය)**

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

- ඩී.ඊ.එන් 201 (ඉලෙක්ට්‍රොනික) සහ ඩී.ඊ.එන් 202 (ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ) සඳහා දේශන ද්‍රව්‍ය සමූහය සකස් කිරීම.
- ඉලෙක්ට්‍රොනික රසායනාගාරයේ ප්‍රායෝගික පන්ති සම්බන්ධීකරනය කිරීම.
- ඉලෙක්ට්‍රොනික රසායනාගාරයට අවශ්‍ය පිරිවිතර සකස් කිරීම.
- ඉලෙක්ට්‍රොනික පාඨමාලාව සඳහා යාවත්කාලීන රසායනාගාර අත්හදා බැලීම
- ඩී.ඊ.එන් 201 (ඉලෙක්ට්‍රොනික) සහ ඩී.ඊ.එන් 202 (ඉලේකට්‍රොනික සහ විදුලිසන්දේශ) පිළිබඳ දේශන පැවැත්වීම සහ පරීක්ෂණ පැවැත්වීම.

**බාහිර ආයතන**

- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන යන්ත්‍ර පුහුණු අගැයීම් මණ්ඩලයෙහි සේවය කිරීම.

**කායයී මණ්ඩල සංවර්ධනය**

- කොළඹ විශ්වවිද්‍යාලයේ කායයී මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන උසස් අධ්‍යාපන ඉගැන්වීම් සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කිරීම සහ SEDA පිළිගැනීම ලබාගැනීම.
- HETC මගින් ක්‍රියාත්මක කරන ලද පයෙයීෂණ හැකියාවන් පිළිබඳ වැඩමුළුවට සහභාගි වීම.

**ප්‍රසූති නිවාඩු**

- 2012.11.09 දින සිට ප්‍රසූති නිවාඩු ලබා සිටි.

5. **ජී.ඒ.එම්.ඩී වික්‍රමතිලක මයා** **බී.එස්.සී (ඉංජිනේරු) ගෞරව, ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සංගමයේ සහාය සමාජික.**

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

පහත සඳහන් විෂයයන් පිළිබඳව ප්‍රයෝගික පන්ති අධීක්ෂණය කොට පවත්වන ලදී.

(1) ඞ්.ඊ.ඊ 204 බලශක්ති පාලනය සහ ඉලෙක්ට්‍රොනික
(11) ඞ්.ඊ.ඊ 205 රූප සටහන්හි විදුලි රැහැන් යෙදීම සහ විදුලි ස්ථාපනය කිරීම

පහත සඳහන් විෂයයන් පිළිබඳව දේශන පැවැත්වීම සහ පරීක්ෂණ පැවැත්වීම

(1) ඞ්.ඊ.ඊ 205 රූපසටහන්හි විදුලි රැහැන් යෙදීම් සහ විදුලි ස්ථාපනය කිරීම
(11) ඞ්.ඊ.ඊ 204 බලශක්ති පාලනය සහ ඉලෙක්ට්‍රොනික
(111) ඞ්.ඊ.ඊ 201 ව්‍යවහාරික විදුලිය

- එන්.ඞ්.ටි ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගරික ලෙස සේවය කරන ලදී.
- යන්ත්‍ර පුහුණු අවස්ථාවන්හි දී සිසුන් පරීක්ෂා කිරීම.
- INCO ප්‍රදර්ශනය සංවිධාන කොමිටුවෙහි සේවය කිරීම.
- එන්.ඞ්.ටී සාමාරම්භක වැඩසටහන සංවිධාන කොමිටුවෙහි සේවය කිරීම.

**කායයී මණ්ඩල සංවර්ධනය**

- කොළඹ විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද සී.ටී.එච්.සී පාඨමලාවට සහභාගි වීම.

**බාහිර ආයතන**

- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන යන්ත්‍ර පුහුණු ඇගයීම් මණ්ඩලයේ සේවය කිරීම.
- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරීය විසින් සංවිධානය කරනු ලබන පාඨමාලා ඇගැයීම් කමිටුවෙහි සේවය කිරීම.
- විදුලිය ඉංජිනේරු තාක්ෂණය සඳහා එන්.ඞ්.ටි සිසුන්ට පුහුණුව ලබාදීම සඳහා සුදානම් කෙරෙන කමිටුවෙහි සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම.

6. ඉංජිනේරු ගාමිණි ඩී. නානායක්කාර — බී.ටෙක්(ඉංජිනේරු) ඊසී (එක්සත් රාජධානිය) එෆ්.ටී.සී (එක්සත් රාජධානිය), එම්.අයි.ඊ (ශ්‍රී ලංකා) සී. ඉංජිනේරු (ශ්‍රී ලංකා) එම්.අයි.ඊඊ (එක්සත් රාජධානිය) සී. ඉංජිනේරු (එක්සත් රාජධානිය) එෆ් අයි ඊඊ (ශ්‍රී ලංකා)

**මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ රාජකාරි**

පහත සඳහන් විෂයයන් පිළිබඳ දේශන, ප්‍රායෝගික පන්ති සහ පරීක්ෂණ පැවැත්වීම.

(1) ඩී.ඊ.එන් 205 විදුලි සන්දේශ 1
(11) ඩී.ඊ.එන් 206 විදුලි සන්දේශ 11

**කායයී මණ්ඩල සංවර්ධනය**

පශ්චාත් උපාධි දර්ශනපති/ ආචාර්ය උපාධි වැඩසටහන සම්බන්ධ කටයුතු කරමින් සිටින අතර වසර දෙකක් සාර්ථකව නිමකර ඇත.

**බාහිර ආයතන**

- ජාතික ආධුනිකත්ව කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන යන්ත්‍ර පුහුණු අගැයීම් මණ්ඩලයෙහි සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම.
- තාක්ෂණ ඇගයීම් කොමිටු මණ්ඩල සාමාජික - මොරටු විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

**(7) ටී.එම් අස්ලාම් මහතා** — **බී.ටෙක් (ඉංජිනේරු) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සහාය සමාජික**

මොරටු විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ රාජකාරී කටයුතු

පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රායෝගික පන්ති අධීක්ෂනය කරන ලදී.

(1) ඩී.ඊ.ඊ 101 ඉලෙක්ට්‍රො තාක්ෂණය
(11) ඩී.ඊ.එන් 101 ඉලේකට්‍රොනික

පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රායෝගික පන්ති අධික්ෂණය කරන ලදී.

(1) ඩී.ඊ.එන් 101 ඉලෙක්ට්‍රොනික
(11) ඩී.ඊ.එන් 203 කර්මාන්ත ඉලේකට්‍රොනික සහ මිනුම්
අධ්‍යයන පාඨමාලා අවසන් කිරීමෙන් පසු පිලිගත් උපාධි පාඨමාලාවක් හදාරන එන්.ඩී.ටී ශිෂ්‍යයන් හට ලැබිය යුතු අවස්ථාවන් පිළිබඳව, සමහර විදේශීය විශ්වවිද්‍යාල අඛණ්ඩව සකස් කිරීම සහකරුණු ඉදිරිපත් කිරීම් සිදුකරනු ලැබේ. ඉංජිනේරු කවුන්සලය (එක්සත්රාජධානිය) වෙනුවෙන් පරීක්ෂණ පවත්වන සිටි ඇන්ඩ් ගිල්ස් ලන්ඩන් ආයතනයෙහි දේශිය ශාඛාව සමඟද ආයතනය සම්බන්ධතා පවත්වනු ලැබේ. ඉංජිනේරු කවුන්සලය (එක්සත් රාජධානිය) විසින් පවත්වනු ලබන විභාග එන්.ඩී.ටී සිසුන් හට වරලත් ඉංජිනේරු සුදුසුකම් ලබාගැනීම සඳහා පහසුකම් සලසා දෙයි. ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් නියෝජනය කරන එකම වෘත්තීය ආයතනය ලෙස සැලකෙන ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ නීතිගත ආයතනය සමගද ඉතා ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වනු ලැබේ. එන්.ඩී.ටී පාඨමාලාව අවසන් කිරීමෙන් පසු මෙම ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුස්සන් වන අතර අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව නෛතික ඉංජිනේරු තත්ත්වය ලබාගැනීමටද හැකිවේ.

## 14 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය :

| වැය විෂයය | 2011 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| පෞද්ගලික වේතන වියදම් | 60,153,580 | 62,767,021 |
| ගමන් වියදම් | 42,250 | 75,501 |
| සැපයීම් වියදම් | 2,602,868 | 2,761,555 |
| නඩත්තු වියදම් | 401,086 | 1,187,736 |
| ගිවිසුම්ගත සේවා වියදම් | 4,305,925 | 4,212,321 |
| වෙනත් | 4,407,148 | 7,730,242 |
| **එකතුව** | **71,912,875** | **78,734,376** |

## 15. මූලධන වියදම් පිළිබඳ විස්තරය:

| වැය විෂයය | 2011 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| දැව භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 3,463,720 | 684,805 |
| යන්ත්‍ර මිලදී ගැනීම | 0 | 0 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 120,098 | 251,874 |
| වෙනත් (පොත් සහ වාර සගරා) | 82,250 | 435,241 |
| **එකතුව** | **3,666,068** | **1,371,920** |

**16.** **(දේශිය / විදේශීය අරමුදලින්) කෙරෙන ව්‍යාපෘති විස්තර :** අදාල නොවේ

| නම සහ විස්තර | ණය/ආධාර | අරමුදල් ප්‍රදානය | ටී.සී.ඊ (රුපි) | ආර්.එෆ්.ඒ (රුපි) | ඩී.එෆ් (රුපි) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

(පි.ඩි.එස්.එල් / ඒ.ඩී.බී/ අයි.සි.ඒ/ ඩබ්.බි ................)

**17.** ව්‍යාපෘති වැය (දේශිය / විදේශිය අරමුදලින්) කෙරෙන ව්‍යාපෘති විස්තර

| ව්‍යාපෘතියේ නම | මුළු පිරිවැය රුපි. | 2011 වැය රුපි. | 2012 වැය රුපි. | 2012.12.31 දිනට මුළු වැය | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය දියගම භූමියෙහි නව ස්ථානගත කිරීම් | | 7,666,735 | 179,540 | 51,211,018 | |
| | | | | | |
| එකතුව | | 7,666,735 | 179,540 | 51,211,018 | |

**18.** **මූල්‍යාමය වැය ප්‍රගතිය පිළිබඳ විස්තර:** අදාල නොවේ

| විෂයය | 2012 වර්ෂය සඳහා වෙන්කිරීම් (රුපි) | 2012 වර්ෂයේ වැය (රුපි) | ඉතිරිය / අතිරික්තය (රුපි) |
|---|---|---|---|
| ව්‍යාපෘති හැර පුනරාවර්තන වැය | | | |
| ව්‍යාපෘති හැර මූලධන | | | |
| ව්‍යාපෘති - දේශිය අරමුදල් | | | |
| ව්‍යාපෘති - විදේශිය අරමුදල් | | | |
| එකතුව | | | |

**19.** මූලාශ්‍රමය කාර්ය සාධන විශ්ලේෂණය (උපදවන ලද අදායම): අදාල නොවේ

| අදායම් මූලාශ්‍ර | 2012 වර්ෂය සඳහා වෙන්කිරීම් (රුපි) | 2012 වර්ෂයේ එකතුවූ මුදල (රුපි) | ඌනතාවය / අතිරික්තය (රුපි) |
|---|---|---|---|
| සාමාන්‍ය උපාධි අධ්‍යනය | | | |
| පශ්චාත් උපාධි අධ්‍යනය | | | |
| උපදේශන සේවා | | | |
| වෙනත් | | | |
| **එකතුව** | | | |

**20.** මූලාශ්‍රමය කාර්ය සාධන විශ්ලේෂණය – **2012:**

| විෂයය | සූත්‍රය | ඒක ශිෂ්‍ය වියදම (රුපි) |
|---|---|---|
| ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම (ආර්.ඊ) | පුනරාවර්තන / මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 88,914 |
| ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම (සී.ඊ) | මූලධන වැය / මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 1,487 |
| | | |
| මුළු වැය | | **90,401** |

**21.** 2012 වර්ෂයේදී කෙරුනු යටිතල පහසුකම් පිළිබඳ විස්තර:

| යටිතල පහසුකම් විස්තර | වැය කරන ලද මුදල (රුපි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

තාක්ෂණික ආයතන, මොරටුව විශ්වවිද්‍යාලය
2012 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2012 | 2012 | | 2011 | 2011 |
|---|---|---|---|---|---|---|
| | | රුපි. | රුපි. | රුපි. | රුපි. | රුපි. |
| වත්කම් | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 1 | 11,559,779 | | | 30,362,637 | |
| ලැබිය යුතු දෑ | 2 | 5,730,996 | | | 5,071,870 | |
| තොගය | | 938,477 | **18,229,252** | | 615,230 | **36,049,737** |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| ආයෝජන (දිගුකාලීන) | 3 | | **28,909,989** | | | **9,224,495.00** |
| දේපල පිරියත හා උපකරණ | 4 | 63,970,556 | | | 58,709,301 | |
| කෙරීගෙන යන වැඩ | 4(a) | 5,286,444 | | | 12,178,640 | |
| වෙනත් වත්කම් | 5 | 1,193,329 | | | 1,475,917 | |
| | | | **70,450,329** | | | **72,363,858** |
| **මුළු වත්කම්** | | | **117,589,570** | | | **117,638,090** |
| බැරකම් | | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | |
| ගෙවිය යුතු දෑ | 6 | 4,665,588 | | | 5,850,260 | |
| විලම්භිත ආදායම් | 7 | 2,177,423 | | | 1,683,143 | |
| උපචිත වියදම් | 8 | 3,030,231 | **9,873,242** | | 2,100,869 | **9,634,272** |
| **ජංගම නොවන බැරකම්** | | | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම | | | **11,975,017** | | | **12,606,970** |
| **මුළු බැරකම්** | | | **(21,848,259)** | | | **(22,241,242)** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **95,741,311** | | | **95,396,848** |
| **ශුද්ධ වත්කම් සහ හිමිකම්** | | | | | | |
| වැය වූ මූලධන ආධාර | 9 | 30,998,880 | | | 34,081,951 | |
| කෙරී ගෙන යන වැඩ ප්‍රාග්ධන | 9(a) | 30,286,444 | | | 30,106,904 | |
| වැය නොවූ මූලධන ආධාර | 10 | 26,675,468 | | | 27,076,928 | |
| පොදු සංචිත | 11 | (17,939,735) | | | (15,377,749) | |
| පරිත්‍යාග | 12 | 3,975,000 | | | 3,975,000 | |
| මූල්‍ය නොවන රාජ්‍ය දීමනා | 13 | 7,250,000 | | | 4,200,000 | |
| එක්රැස් වූ අරමුදල | 14 | 14,495,254 | | | 11,333,814 | |
| | | | **95,741,311** | | | **95,396,848** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **95,741,311** | | | **95,396,848** |

නිවරදි බවට සහතික කරමු.

| එම්. එම්. පී. ඩී. සමරසේකර | එස්. සිරිමාන්න | කේ. සී. එස්. පෙරේරා |
|---|---|---|
| අධ්‍යක්ෂ | නියෝජ්‍ය මූල්‍යාධිකාරී | නියෝජ්‍ය ලේඛකාධිකාරී |

## තාක්ෂණික ආයතන, මොරටුව විශ්වවිද්‍යාලය
## 2012 දෙසැම්බර් 31 වන දිනන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | රුපි. | රුපි. |
| පුනරාවර්තන ආධාර | | 74,700,000 | 74,732,645 |
| වි.වි.ප්‍ර.කොමිසන් සභාවෙන් ලද රජයේ ආධාර | | | |
| රජයෙ ආධාර මහපොළ | | 1,847,000 | 2,937,000 |
| රජයේ ආධාර ශිෂ්‍යාධාර | | 12,156,150 | 9,958,050 |
| වෙනත් ආදායම්. | 15 | 1,788,690 | 2,014,628 |
| ක්‍රමක්ෂය | | 5,249,994 | 5,654,355 |
| | | **95,741,834** | **95,296,678** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| වැටුප් හා වේතන | 16 | 62,767,021 | 60,153,580 |
| ගමන් වියදම් | 17 | 75,501 | 42,250 |
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය | 18 | 2,761,555 | 2,602,868 |
| නඩත්තු කිරීමේ වියදම් | 19 | 1,187,736 | 401,086 |
| ගිවිසුම් සේවා | 20 | 4,212,321 | 4,305,925 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 21 | 416,180 | 279,519 |
| ක්ෂය හා ක්‍රමක්ෂය | | 6,514,994 | 5,654,348 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 22 | 7,314,062 | 4,127,629 |
| මහපොළ | | 1,847,000 | 2,937,000 |
| ශිෂ්‍යාධාර | | 12,156,150 | 9,958,050 |
| මුළු මෙහෙයුම් වියදම් | | **99,252,520** | **90,462,255** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ අතිරික්තය/ඌණතාවය** | | **-3,510,686** | **4,834,423** |

එස්. සිරිමාන්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

| සටහන | 9 | 9(a) | 10 | 11 | 12 | 13 | 14 | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැය වූ මූලධන ආධාර | ඉඩම් සඳහා ගෙවීම් | වැය වූ මූලධන ආධාර | පොදු සංචිත | පරිත්‍යාග | මූල්‍ය නොවන රජයේ ආධාර | එක්රැස් වූ අරමුදල | එකතුව |
| | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 15,145,663 | 30,106,904 | 33,609,731 | (20,367,729) | 3,975,000 | 0 | 10,558,382 | 73,027,951 |
| | | | | | | | | 0 |
| මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශනයේ හඳුනා | | | | | | | | |
| නොගන්නා ලද ශුද්ධ ප්‍රතිලාභ හෝ පාඩු | | | | 155,557 | | | | 155,557 |
| මාරු කිරීම්/ චලනයන් | 24,590,643 | 0 | (6,532,803) | | | 4,200,000 | 775,432 | 23,033,272 |
| කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය හෝ ඌණතාවය | | | | 4,834,423 | | | | 4,834,423 |
| ක්‍රමක්ෂය | (5,654,355) | | | | | | | (5,654,355) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 34,081,951 | 30,106,904 | 27,076,928 | (15,377,749) | 3,975,000 | 4,200,000 | 11,333,814 | 95,396,848 |
| | | | | | | | | 0 |
| කාලපරිච්ඡේදය සඳහා දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | | | | | | | | |
| මාරු කිරීම්/ චලනයන් | 2,229,508 | 179,540 | (401,460) | | | 3,050,000 | 3,161,440 | 8,219,028 |
| | | | | 948,700 | | | | 948,700 |
| මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශනයේ හඳුනා | | | | | | | | |
| නොගන්නා ලද ශුද්ධ ප්‍රතිලාභ හෝ පාඩු | | | | | | | | |
| ක්‍රමක්ෂය | (5,312,579) | | | | | | | (5,312,579) |
| | | | | -3,510,686 | | | | -3,510,686 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 30,998,880 | 30,286,444 | 26,675,468 | (17,939,735) | 3,975,000 | 7,250,000 | 14,495,254 | 95,741,311 |

එස්. සිරිමාන්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන් | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රුපි. | රුපි. | රුපි. | රුපි. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | | | |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ අතිරික්තය/ඌණතාවය** | | -3,510,686 | | 4,834,423 | |
| **මුදල් නොවන වෙනස් වීම්** | | | | | |
| වෙනත් ගැලපීම් | 24 | 1,743,700 | | 155,557 | |
| බැර ගැලපීම් | | | | | |
| ක්ෂය කිරීම් | | 6,514,994 | | 5,654,348 | |
| ක්‍රමක්ෂය | | -5,249,994 | | -5,654,355 | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | -631,953 | | 775,347 | |
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම්/අඩුවීම්** | | | | | |
| ලැබීම් වල වැඩිවීම්/අඩුවීම් | 25 | -982,372 | | 974,065 | |
| අත්හැර දැමූ ආදායම් වැඩිවීම්/අඩුවීම් | | 494,280 | | -84,623 | |
| ගෙවීම් වල වැඩිවීම්/අඩුවීම් | 26 | -1,184,672 | | -3,962,389 | |
| උපචිත වියදම් වැඩිවීම්/අඩුවීම් | | -929,362 | | 1,428,102 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | -1,877,341 | | 4,120,475 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | | |
| යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඒ සහ බී) | | -1,371,923 | | -3,666,068 | |
| ඉඩම් සඳහා ගෙවීම් (මූලධන) | | -179,540 | | -7,666,735 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | -1,551,463 | | -11,332,803 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | | |
| මූලධන ආධාර | 10 | 1,150,000 | | 4,800,000 | |
| නිශ්චිත අරමුදල් වැඩිවීම | | 3,161,440 | | 775,432 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 4,311,440 | | 5,575,432 |
| මුදල් හා මුදල් සමාන ද්‍ර වල ශුද්ධ වැඩිවීම්/අඩුවීම් | | | 882,636 | | -1,636,896 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන ද්‍ර | | | 39,587,132 | | 41,224,028 |
| **කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන** | 27 | | **40,469,768** | | **39,587,132** |

එස්. සිරිමාන්න

නියෝජ්‍ය මූල්‍යාධිකාරී

**අභ්‍යන්තර විගණනය**

මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනය විසින් 2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද රාජකාරි කටයුතු පහත සඳහන් පරිදි වේ.

1 අර්ථ සාධක අරමුදල් ආපසු ගෙවීම් 29 ක්, පාරිතෝෂික ගෙවීම් 5 ක් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් 1 ක් පූර්ව විගණනය කිරීම.

2 විශ්වවිද්‍යාල අර්ථසාධක දායක මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කිරීම පරීක්ෂා කරන ලදී.

3 මිලදී ගැනීම් විමර්ශනය කිරීම.

4 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක හරකාර අරමුදල් සහ පාරිතෝෂික අරමුදලට ගෙවීම් කිරීම සඳහා 2006-01-01 සිට ජීවන වියදම් ගණනය කිරීම විගණනය කිරීම.

5 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අයි.එන් ජයතිලක මිය විසින්බැඳුම්කර කඩකිරීම විමර්ශනය කිරීම.

**අ.ක / නියෝජ්‍ය අභ්‍යන්තර විගණන නිලධාරී**

**මොරටුව විශ්වවිද්‍යාලය**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No ටීසී/ඩී/අයිටීයූඑම්/එෆ්එස්/2012 ඔබේ අංකය / உமது இல / Your No. දිනය / திகதி / Date 2014 ජනවාරි 07 දින

අධ්‍යක්ෂ,

තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය.

**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාව් දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂක වෙත 2013 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලින් ගෙවා තිබූ වාහන රක්ෂණ ගාස්තු රු.145,544 ක් හා යන්ත්‍රෝපකරණ සේවා වියදම් රු.31,115 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කලින් ගෙවූ වියදමක් ලෙස දක්වා නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන පාර්තෝෂික වෙන්කිරීම රු.1,681,875 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.32,887,662 ක් වූ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණද ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු පිරිවැය රු.7,250,000 ක් වූ මෝටර් රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රමක්ෂය රු.1,123,333 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු.4,900,000 ක් වටිනා වෑන්රථය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගිණුම්ගත කර නොතිබීම නිසා මෝටර් රථ ක්ෂය රු.653,333 කින් අඩුවෙන් දැක්වෙන අතර මෝටර් රථ ක්ෂය වෙන්කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

(i) සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.138,040 ක සේවක ණය නැවත අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙකුගේ පාර්තෝෂික මුදල් 2013 පෙබරවාරි 26 දින නිදහස් කර තිබුණත් රු.11,875 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) රු.108,350 ක සේවක ණය පියවීම පැහැර හැර ඇති හිටපු කථිකාචාර්යවරයෙකු, නැවත කොන්ත්‍රාත්තු පදනම මත සේවයේ යොදවා තිබුණු අතර එම ණය මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

(i) 2007 හා 2009 වර්ෂවල සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.57,883 ක් වූ බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ තුනක සිට පැවතෙන රු.141,423 ක් වූ ගෙවියයුතු අතුරැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් යටතේ නිරූපණය කෙරෙන විද්‍යාගාර හා පුස්තකාල තැන්පතුවල වටිනාකම රු.542,650 ක් වන අතර එම ශේෂය තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටව යන වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි.

36

## 2.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිවාඩු දින දීමනා ලබාගැනීමේදී, මසකට එක් දිනකට සීමා කළයුතු වුවත්, ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකුට මසකට එක් නිවාඩු දිනයක් ඉක්මවා දින 01 සිට 04 දක්වා නිවාඩු දින දීමනා ලෙස රු.77,236 ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ) | 2011 ඔක්තෝබර් 12 දිනැති මොරටුව විශ්වවිද්‍යාලයේ ලේකම්ධිකාරීගේ , ස්ථාවර නියෝග අංක 50 - 2 | පරිපාලන නිලධාරීන්, මූල්‍ය නිලධාරීන් හා සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන්ගේ සේවා කාලය පැය 7 විනාඩි 45 ක් වුවද, එම කාලසීමාවට වඩා අඩුවෙන් රාජකාරි සිදුකර ඇති නිලධාරීන්ට නිවාඩු දීමනා ලෙස රු.64,406 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2011 අප්‍රේල් 20 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2011 | පර්යේෂණ දීමනා ගෙවීම සඳහා අවම සුදුසුකම් වශයෙන් ජාත්‍යන්තරව හෝ දේශීයව හෝ පර්යේෂණවල ප්‍රතිඵල සම්භාෂණයක/ සම්මන්ත්‍රණයක හෝ තාක්ෂණික සැසියක පළකල බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීම කළ යුතු අතර එම පර්යේෂණ කටයුතු, පර්යේෂණ දීමනාවට හිමිකම් ලබන වසරටද අදාලව සක්‍රියව සිදුකරමින් පවතින බවට සාක්ෂි ඉදිරිපත් කිරීම කළයුතු වුවත්, 2011 වර්ෂයේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර තිබෙන කථිකාචාර්යවරු 11 දෙනෙක් සඳහා 2012 වර්ෂයේ එම පර්යේෂණ සක්‍රීයව සිදුකරන බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. එම කථිකාචාර්යවරුන්හට 2012 වර්ෂය තුළදීද පර්යේෂණ දීමනා ලෙස රු.897,023 ක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ක්‍රමක්ෂය ගණන් ගැනීමට පෙර රු.83,460,680 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.75,552,577 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.74,700,000 ක් වූ රජයේ ප්‍රදානය හා රු.5,249,994 ක ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු.3,510,686 ක් දක්වා අඩු වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.74,732,645 ක් වූ රජයේ ප්‍රදානය හා රු.5,654,355 ක් වූ ක්‍රමක්ෂය හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.4,834,423 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012<br>රු. | 2011<br>රු. | වෙනස<br>රු. | වෙනස්වීමේ ප්‍රතිශතය<br>සියයට |
|---|---|---|---|---|
| ආදායම | 95,741,834 | 95,296,678 | 445,156 | 0.47 |
| වියදම | 99,252,520 | 90,462,255 | 8,790,265 | 9.72 |
| අතිරික්තය/(ඌනතාවය) | (3,510,686) | 4,834,423 | 8,345,109 | (172.26) |

#### 3.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

68

| විෂයය | 2012 | 2011 | වෙනස | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| ජංගම නොවන වත්කම් | 99,360,318 | 81,588,353 | 17,771,965 | 21.78 |
| ජංගම වත්කම් | 18,229,252 | 36,049,737 | (17,820,485) | (49.43) |
| ජංගම වගකීම් | 9,873,242 | 9,634,272 | 238,970 | 2.48 |
| ජංගම නොවන වගකීම් | 11,975,017 | 12,606,970 | 631,953 | 5.01 |
| ශුද්ධ වත්කම් | 95,741,311 | 95,396,848 | 344,463 | 0.36 |

### 3.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සියයට |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,877,341) | 4,120,475 | (5,997,816) | (146.56) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,551,463) | (11,332,803) | 9,781,340 | 86.31 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 4,311,440 | 5,575,432 | (1,263,992) | (22.67) |
| ආරම්භක මුදල් සහ මුදල් හා සමාන දෑ | 39,587,132 | 41,224,028 | (1,636,896) | (3.97) |
| අවසාන මුදල් සහ මුදල් හා සමාන දෑ | 40,469,768 | 39,587,132 | 882,636 | 2.23 |

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2012 වර්ෂය තුළ මාසිකව, සාමාන්‍යයෙන් රු.23,539,484 කට නොඅඩු මුදලක් බැංකු ජංගම ගිණුම් දෙකක රඳවාගෙන තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොලී ආදායමක් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පසුගිය වර්ෂ 05 තුළ ආයතනයට බඳවා ගත් ශිෂ්‍යයින්, ඉගෙනුම ලැබූ ශිෂ්‍යයින් හා පිටව ගිය ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව සහ වාර්ෂිකව දැරූ අයහාර වියදම්වල විස්තරයක් පහත දැක්වේ.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මුළු ශිෂ්‍යයින් | 974 | 987 | 987 | 1016 | 1043 |
| බඳවා ගැනීම් | 369 | 360 | 360 | 358 | 352 |
| අවසාන වර්ෂයේදී ආයතනයෙන් බාහිරව පුහුණුවීම් කටයුතු, කරන බැවින් එසේ ආයතනයෙන් බැහැරව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 298 | 295 | 310 | 329 | 347 |
| ආයතනය තුළ ඉගෙනීම කළ මුළු ශිෂ්‍යයින් | 676 | 692 | 677 | 687 | 696 |
| ඩිප්ලෝමාධාරීන් | 303 | 336 | 299 | 296 | 289 |
| වාර්ෂික අයහාර වියදම රු. | 74,310,447 | 78,644,210 | 83,482,537 | 90,462,255 | 99,252,520 |
| ඒක ශිෂ්‍ය වියදම රු. | 109,927 | 113,648 | 123,312 | 131,677 | 142,604 |
| මහපොළ ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | 209 | 206 | 204 | 208 | 210 |
| ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | 469 | 451 | 494 | 499 | 475 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2008 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 369 කින් 2012 වර්ෂයේදී ඩිප්ලෝමා සමත් වූ ශිෂ්‍යයින් 289 ක් හෙවත් සියයට 78 ක් විය.

(ආ) තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලද 2000 වර්ෂයේදී බඳවා ගත් ශිෂ්‍යයින් 350 ක් වීම හා 2012 වර්ෂයේ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 352 ක් වීම නිසා ආයතනය පිහිටුවා වර්ෂ 12 ක කාලයක් ගතවී තිබියදීත්, බඳවා ගැනීම්වල වර්ධනය සියයට 0.57 ක් පමණක් වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

2009 සහ 2010 වර්ෂයේ දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.1,618,050 ක් අරමුණුගත කාර්යයන් ඉටු නොකර, විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

------------------------

නියමිත දිනට සේවක භාරකාර අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.15,167 ක අධිභාරයක් ගෙවීම් කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යමණ්ඩලය හා අනෙකුත් කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | | අනුමත කථිකාචාර්යවරු සංඛ්‍යාව | සත්‍ය කථිකාචාර්යවරු සංඛ්‍යාව | පුරප්පාඩු කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | කථිකාචාර්යවරු | 27 | 19 | 08 |
| (ii) | ආධුනික කථිකාචාර්යවරු | 17 | 12 | 05 |

(ආ) අනෙකුත් කාර්ය මණ්ඩලය

| | | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 04 | 02 | 02 |
| (ii) | මාණ්ඩලික නොවන | 29 | 14 | 15 |

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාර සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 7 සිට සියයට 72 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ජේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2010 සහ 2011 වර්ෂවල වාර්ෂික වාර්තා 2013 අගෝස්තු 19 දින වනවිට සභාගතකර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂකවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) උපයෝගී ලේඛණය
(ඇ) ණය අයකිරීම
(ඈ) ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්
(ඉ) මුදල් සහ බැංකු පාලනය
(ඊ) පර්යේෂණ දීමනා පාලනය
(උ) අභ්‍යන්තර විගණනය
(ඌ) අයවැය පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
| --- | --- |
| **2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | **2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| **2.2.1 ගිණුම්කරණ අඩුපාඩු** | **2.2.1 ගිණුම්කරණ අඩුපාඩු** |
| පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | විගණන නිරීක්ෂණයන් සඳහා පිළිතුරු පහත සඳහන් පරිදි වේ. |
| (අ) කලින් ගෙවා තිබූ වාහන රක්ෂණ ගාස්තු රු. 145,544 ක් හා යන්ත්‍රෝපකරණ සේවා වියදම් රු. 31,115 ක් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කලින් ගෙවූ වියදමක් ලෙස දක්වා නොතිබුණි. | (අ) 2013 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී වාහන රක්ෂණ ගාස්තු වෙනුවෙන් කරන ලද වියදම් හා යන්ත්‍රොපකරණ සේවා වියදම් වලට අදාල පෙර ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) මුල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන පාරිතෝෂික වෙන්කිරීම රු. 1,681,875 කින් අඩුවෙන් දක්වා තිබුණි. | (ආ) 2012 වර්ෂයේ ආයතනයේ කාර්ය මණ්ඩලයට පාරිතෝෂිත මුදල් වෙන් කිරීමේදී ජීවන වියදම් දීමනාව ගණනය කිරීමට අතපසුවීම නිසා රු. 1, 681,875.00 අඩුවෙන් ගිණුම් වල දක්වා ඇත. 2013 වර්ෂයේදී ජීවන වියදම් දීමනාව ද සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) 2012 දෙසැම්බර් 31 දිනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු. 32,887,662 ක් වූ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණද ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි. | (ඇ) රු. 32,887,662.00 ක් වූ ස්ථාවර වත්කම් පිරිවැය නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරිම අවශ්‍ය බවට එකග වන අතර මේ වන විටත් ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටුකරමින් පවතින බව දන්වනු කැමැත්තෙමි. |
| (ඇ) ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු පිරිවැය රු.7,250,000 ක් වූ මෝටර් රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රම ක්ෂය රු. 1,123,333 ක් ගිණුම්ගත කර නොතිබුණි. | (ඇ) පිරිවැය රු. 7,250,000 ක්වූ මොටර් රථය වෙනුවෙන් 2012 වර්ෂයේ ක්‍රම ක්ෂය රු. 1,123,333.00 ක් ගැලපීම් කර නොමැත. 2013 වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ගැලපීම් කිරිමට කටයුතු කරන බව සඳහන් කරමි. |
| (ඉ) 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු. 4,900,000 ක් වටිනා වෑන්රථය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගිණුම්ගත කර නොතිබීම නිසා මෝටර් රථ ක්ෂය රු. 653,333 කින් අඩුවෙන් දැක්වෙන අතර මෝටර් රථ ක්ෂය වෙන්කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | (ඉ) රු. 4,900,000.00 ක් වටිනා WP-NA 3020 දරන වෑන් රථය 2012 වර්ෂයට අදාල ක්ෂය රු. 653,333.00 මේ වන විට නිවැරදි කර ඇත. |

විගනන මතය

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ලැබිය යුතු ගිණුම්

(i) සේවයෙන් ඉවත්වූ නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 138,040 ක සේවක ණය නැවත අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙකුගේ පාරිතෝෂික මුදල් 2013 පෙබරවාරි 26 දින නිදහස් කර තිබුණත් රු. 11,875 ක් වු සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) රු. 108,350 ක සේවක ණය පියවීම පැහැර හැර ඇති හිටපු කථිකාචාර්යවරයෙකු, නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණු අතර එම ණය මුදල සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකරගෙන නොතිබුණි.

පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

(i) සේවයෙන් ඉවත් වු නිළධාරීන් පස්දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 138,040.00 ක් ලෙස සඳහන් කර තිබුණද, සත්‍ය අයවිය යුතු සේවක ණය මුදල රු. 234,515.00 ක් ලෙස නිවැරදි විය යුතු බව සඳහන් කරන අතර විස්තර පහත දක්වා ඇත. අයි.එන් ජයතිලක මහත්මියගේ ණය ශේෂය වන රු. 11,875.00 ක මුදල 2013.09.30 දින මෙම ආයතනය විසින් අය කරගෙන ඇත.

| සේවකයාගේ නම | ණය වර්ගය | ශේෂය |
|---|---|---|
| එම්.ඩී.සී.එස්.කේ අඹේපිටිය | අපදා ණය<br>සේවක ණය | රු. 56,780.00<br>රු. 4,080.00 |
| කේ.ගමගේ | අපදා ණය | රු.15,225.00 |
| බී.බාලසුබ්‍රමනියම් | අපදා ණය | රු. 12,000.00 |
| ඩබ්.ඒ ඉන්දිරා | අපදා ණය | රු.38,080.00 |
| එස්.සී මතුගම | අපදා ණය<br>වාහන ණය<br>උත්සව අත්තිකාරම් | රු. 4,350.00<br>රු.102,000.00<br>රු. 2,000.00 |

අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදි මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

(ii) දැනට කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්ය තනතුරකට පත්කර ඇති එස්.සී මතුගම මහත්මියගෙන් අය විය යුතු රු. 108,350.00 ක ණය ශේෂය සම්බන්ධයෙන් 22 වන විගණන කමිටුවේ නිර්දේශය පරිදි එම මහත්මියගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරිමේදී එකවර අය කරගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | **(ආ) ගෙවිය යුතු ගිණුම්** |
| (i) 2007 හා 2009 වර්ෂවල සිට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 57, 883 ක් වූ බදු මුදල් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | (i) 2007 හා 2009 වර්ෂයේ සිට ඉදිරියට එන දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ගෙවා ඇති රු. 57,883.00 ක් වටිනා බදු මුදල් මේ වන විට නිරවුල් කර ඇත. |
| (ii) වර්ෂ තුනක සිට පැවතෙන රු. 141,423 ක් වූ ගෙවිය යුතු අතරුදවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | (ii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගෙවිය යුතුව තිබූ රඳවාගැනීම් මුදල් රු. 141,423.00 මුදල් මේ වන විට නිරවුල් කර ඇත. |
| **2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම** | **2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම** |
| පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | |
| (අ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් යටතේ නිරුපනය කෙරෙන විද්‍යාගාර හා පුස්තකාල තැන්පතුවල වටිනාකම රු. 542,650 ක් වන අතර එම ශේෂය තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | (අ) රු. 542,650.00 ක් වටිනා විද්‍යාගාර හා පුස්තකාල තැන්පත් විස්තර ඒ ඒ වර්ෂවලට අදාල ලේඛණවලට ඇතුලත් කර ඇත. 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා මුදල් අදායමට ගැනීමටත් 2013 වර්ෂයේ තැන්පත් මුදල් සඳහා විස්තර 2013 වර්ෂයට අදාල තොරතුරු 2013 මූල්‍ය ප්‍රකාශණ සමග ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටව යන වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි. | (ආ) අධ්‍යයන කාර්යය මණ්ඩලය් පැමිණීම හා පිටවීම පිළිබඳව විශ්වවිද්‍යාල පද්ධතිය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරිමට සටහන් තබා ගන්නා ලදී. |

**විගනන මතය**

**2.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිවාඩු දින දීමනා ලබාගැනීමේදී මසකට එක් දිනකට සීමා කළයුතු වුවත්, ආයතනයේ නිලධාරින් 03 දෙනෙකුට මසකට එක් නිවාඩු දිනයක් ඉක්මවා දින 01 සිට 04 දක්වා නිවාඩු දින දීමනා ලෙස රු. 77,236 ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ) 2011 ඔක්තෝබර් 12 දිනැති මොරටුව විශ්වවිද්‍යාලයේ ලේකබාධිකාරිගේ ස්ථාවර නියෝග අංක 50-2 | පරිපාලන නිළධාරීන්, මූල්‍ය නිළධාරීන් හා සමාන්තර ශ්‍රේණිවල නිළධාරින්ගේ සේවා කාලය පැය 7 විනාඩි 45 ක් වුවද, එම කාලසීමාවට වඩා අඩුවෙන් රාජකාරි සිදුකර ඇති නිලධාරින්ට නිවාඩු දීමනා ලෙස රු. 64,406 ක් ගෙවා තිබුණි. |

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

**2.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) තාක්ෂණික ආයතනයේ කළමනාකරණ මණ්ඩලය, COPE කමිටුවේ නිර්දේශය පරිදි අත්‍යවශ්‍ය අවස්ථාවලදී ආයතනයේ නිළධාරින්ට මසකට සති අන්ත දින 1 කට වඩා වැඩි ගනනක් සේවය කිරීමට අවසර ලබා දී ඇත.

(ආ) තාක්ෂණික ආයතනයේ පරිපාලන නිළධාරීන් ආයතනයේ අවශ්‍යතාවය මත සහ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත අදාල වර්ෂයේ අදාල දිනයන්හිදි සේවය පැමිනි බව එවකට හිටපු අධ්‍යක්ෂවරයා සඳහන් කර ඇත. තවද අධ්‍යක්ෂවරයාගේ අනුදැනුම සහ අධීක්ෂනයට යටත්ව ඇතැම් ආයතනික කටයුතු කාර්යාල වේලාවෙන් සහ කටුබැද්ද පරිශ්‍රයෙන් පරිබාහිරව සම්පූර්ණ කිරීමට මෙම නිළධාරීන්ට සිදුවූ බව හිටපු අධ්‍යක්ෂවරයා සඳහන් කර ඇත. (ඉහත කරුණු අනුව උක්ත නිළධාරීන් දක්වා ඇති දින සඳහා නිවාඩු දින දීමනාව ලබාගෙන ඇත්තේ එවකට සිට අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික අධීක්ෂනය ඇතිව බව පෙනේ) පැමිනීම හා පිටවීම යථා ලෙසම සටහන් කර ඇත්තේ කටුබැද්ද පරිශ්‍රයේ සිටි කාලය සනාථ වනු පිනිසයි. මතු කරන ලද කරුනු පිළිබඳව අවධානයෙන් කටයුතු කිරීමට සටහන් තබාගන්නා ලදී.

විගනන මතය

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (ඇ) 2011අප්‍රේල් 20 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2011. | පර්යේෂණ දීමනා ගෙවීම් සඳහා අවම සුදුසුකම් වශයෙන් ජාත්‍යන්තරව හෝ දේශියව හෝ පර්යේෂනවල ප්‍රතිඵල සම්භාෂණයක / සම්මන්ත්‍රණයක හෝ තාක්ෂණික සැසියක පළකල බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීම කළ යුතු අතර එම පර්යේෂණ කටයුතු, පර්යේෂණ දීමනාවට හිමිකම් ලබන වසරටද අදාලව සක්‍රියව සිදුකරමින් පවතින බවට සාක්ෂි ඉදිරිපත් කිරීම කළයුතු වුවත්, 2011 වර්ෂයේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර තිබෙන කථිකාචාර්යවරු 11 දෙනෙක් සඳහා 2012 වර්ෂයේ එම පර්යේෂණ සක්‍රීයව සිදුකරන බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. එම කථිකාචාර්යවරුන්හට 2012 වර්ෂය තුලදීද පර්යේෂණ දීමනා ලෙස රු. 897,023 ක් ගෙවීම් කරතිබුණි. |

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

**(ඇ) පර්යේෂණ දීමනා**

2011 වර්ෂය ආරම්භයේදී පර්යේෂණ යෝජනා ඉදිරිපත් කල තාක්ෂණික ආයතනයේ ආචාර්යවරුන් 2011 වර්ෂයේදී එම පර්යේෂණ සක්‍රීයව සිදුකර එම පර්යේෂණ වල ප්‍රතිඵල 2013 වසරේ මැයි 19 වෙනි දින පවත්වන ලද මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ ප්‍රථම වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රනයේදී ද ප්‍රසිද්ධ කරන ලදී.

01. ඩී.වයි.ටී බඹරවානගේ මිය
02. ජී.ජී ජයරත්න මයා
03. එස්.එම් කන්නන්ගර මිය
04. ජී.ඩී නානායක්කාර මයා
05. ජී.ඒ.එම්.ඩී වික්‍රමතිලක මයා
06. පී.ඩී කුමාර මයා
07. බී.ඒ.එස් ප්‍රියංකා මිය

ඉහත සඳහන් කතිකාචාර්යවරුන්ද ඔවුන්ගේ 2011 සහ 2012 වසර වල කරන ලද පර්යේෂණ වල විද්‍යාත්මක ප්‍රතිඵල ඉහත සඳහන් සම්මන්ත්‍රනයේදී ප්‍රසිද්ධ කර ඉදිරිපත් කෙරින.

බී.ඒ.එස් ප්‍රියංකා මිය - ඉහත දිනට නොපැමිනුනද ඇයගේ පර්යේෂණ වල විද්‍යාත්මක ප්‍රතිඵල 2013 මැයි 13 දින "L" Block හිදී තාක්ෂණික ආයතනයේ පරීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කෙරින.

එම්.ඩී.එස්.ජේ අමරසිරි මහතා - MPhil උපාධියට ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකි. ඔහු 2012 වසරේදී කරන ලද පර්යේෂණයට පේටන්ට් බලපත්‍රය ලබාදීමට ජාතික විද්‍යා පදනම පිළිගෙන ඇත. මෙය විශ්ව විද්‍යාලයේ සෙනෙට් පර්යේෂණ ආධාර (Senate Research Grant )අංක 292 යටතේ කෙරෙයි.

කේ.ගමගේ මිය, එම්.ඒ බිබිලේ මිය සහ ඩී.ජී.යු සෝලංගආරච්චි මයා යන කතිකාචාර්යවරුන් මෙම ආයතනයෙන් විශ්‍රාම /හැර ගොස් ඇත. අමරසිරි මයා, ජයරත්න මයා, ප්‍රියංකා මිය සහ බඹරවානගේ මිය යන කතිකාචාර්යවරුන් ඔවුන්ගේ පරීක්ෂණ දිර්ඝ කිරීමට ලිපි ඉදිරිපත් කර නැති නමුත් ඔවුන් 2012 වසර තුලදි පර්යේෂණ ඉදිරියටත් කරමින් 2013 වසරේදී ඒවා ප්‍රසිද්ධ කර ඇත.එසේ වුවද මින් ඉදිරියට අදාල දිර්ඝ කිරීම් වාර්තා ආදිය නියමිත කලට පර්යේෂණ කමිටු වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන් බවත් මෙයින් දන්වා සිටිමි.

**විගනන මතය**

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ක්‍රමක්ෂය ගණන් ගැනීමට පෙර රු. 83,460,680 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 75,552,577 ක් විය. සමාලෝචිත වර්ෂවයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 74,700,000 ක් වූ රජයේ ප්‍රදානය හා රු. 5,249,994 ක ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු. 3,510,686 ක් දක්වා අඩු වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 74,732,645 ක් වූ රජයේ ප්‍රදානය හා රු. 5,654,355 ක් වූ ක්‍රමක්ෂය හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 4,834,423 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| විෂයය | 2012 රු. | 2011 රු. | වෙනස රු. | වෙනස් වීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ආදායම | 95741834 | 95296678 | 445156 | 0.47 |
| වියදම | 99252520 | 90462255 | 8790265 | 9.72 |
| අතිරික්තය / (ඌනතාවය) | (3510686) | 4834423 | 8345109 | (172.26) |

#### 3.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

එකග වෙමි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

එකග වෙමි

#### 3.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

## විගනන මතය

| විෂයය | 2012 රු. | 2011 රු. | වෙනස රු. | වෙනස් වීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 99,360,318 | 81,588,353 | 17,771,965 | 21.78 |
| ජංගම වත්කම් | 18,229,252 | 36,049,737 | (17,820,485) | (49.43) |
| ජංගම වගකීම් | 9,873,242 | 9,634,272 | 238,970 | 2.48 |
| ජංගම නොවන වගකීම් | 11,975,017 | 12,606,970 | 631,953 | 5.01 |
| **ශුද්ධ වත්කම්** | 95,741,311 | 95,396,848 | 344,463 | 0.36 |

## 3.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

| **විෂයය** | **2012 රු.** | **2011 රු.** | **වෙනස රු.** | **වෙනස් වීමේ ප්‍රතිශතය %** |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,877,341) | 4,120,475 | (5,997,816) | (146.56) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (1,551,463) | (11,332,803) | 9,781,340 | 86.31 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 4,311,440 | 5,575,432 | (1,263,992) | (22.67) |
| ආරම්භක මුදල් සහ මුදල් හා සමාන දෑ | 39,587,132 | 41,224,028 | (1,636,896) | (3.97) |
| අවසාන මුදල් සහ මුදල් හා සමාන දෑ | 40,469,768 | 39,587,132 | 882,636 | 2.23 |

## පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග

එකඟ වෙමි.

## 3.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

එකඟ වෙමි.

**විගනන මතය**

**3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

2012 වර්ෂය තුළ මාසිකව, සාමාන්‍යයෙන් රු. 23,539,484 කට නොඅඩු මුදලක් බැංකු ජංගම ගිණුම් දෙකක රඳවාගෙන තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොලී ආදායමක් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි.

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

**3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

2012 වර්ෂයේ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ විශේෂ තීරණයක් මත දියගම ව්‍යාපෘතියේ සුවිශේෂියභාවය සලකාගත් තීරණයක් අනුව ප්‍රාග්ධන මුදල් මිලියන 17.5 ක් ලංකා බැංකුවේ සත්දින නිවේදන තැන්පත්වල තැබීමට උපදෙස් දෙන ලදී. එම මුදල් දියගම ව්‍යාපෘතියේ හදිසි ඉදිකිරීම් කටයුතු හා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ඉටුකිරීම් සඳහා භාවිතා කරන ලෙසද දන්වා සිටිය බැවින් එසේ සත්දින නිවේදන තැන්පත් යටතේ තබා ඇති අතර ඒ සඳහා 7.5% ක ආයෝජන පොළියක් බැංකුව මඟින් ආයතනය වෙත ලබාදීමට එකග වී ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පසුගිය වර්ෂ 05 තුළ ආයතනයට බඳවා ගත් ශිෂ්‍යයින්, ඉගෙනුම ලැබූ ශිෂ්‍යයින් හා පිටව ගිය ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව සහ වාර්ෂිකව දැරූ අයභාර වියදම්වල විස්තරයක් පහත දැක්වේ.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මුළු ශිෂ්‍යයින් | 974 | 987 | 987 | 1016 | 1043 |
| බඳවා ගැනීම් | 369 | 360 | 360 | 358 | 352 |
| අවසාන වර්ෂයේදී ආයතනයෙන් බාහිරව පුහුණුවීම් කටයුතු කරන බැවින් එසේ ආයතනයෙන් බැහැරව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 298 | 295 | 310 | 329 | 347 |
| ආයතනය තුළ ඉගෙනීම කළ මුළු ශිෂ්‍යයින් | 676 | 692 | 677 | 687 | 696 |
| ඩිප්ලෝමාධාරීන් | 303 | 336 | 299 | 296 | 289 |
| වාර්ෂික අයභාර වියදම රු. | 74,310,447 | 78,644,210 | 83,482,537 | 90,462,255 | 99,252,520 |
| ඒක ශිෂ්‍ය වියදම රු. | 109,927 | 113,648 | 123,312 | 131,677 | 142,604 |
| මහපොළ ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | 209 | 206 | 204 | 208 | 210 |
| ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | 469 | 451 | 494 | 499 | 475 |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**විගනන මතය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2008 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 369 කින් 2012 වර්ෂයේදී ඩිප්ලෝමා සමත් වූ ශිෂ්‍යයින් 289 ක් හෙවත් සියයට 78 ක් විය.

(ආ) තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලද 2000 වර්ෂයේදී බඳවාගත් ශිෂ්‍යයින් 350 ක්වීම හා 2012 වර්ෂයේ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 352 ක් වීම නිසා ආයතනය පිහිටුවා වර්ෂ 12 ක කාලයක් ගතවී තිබියදීත්, බඳවා ගැනිම්වල වර්ධනය සියයට 0.57 ක් පමණක් වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2009 සහ 2010 වර්ෂයේ දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු. 1,618,050 ක් අරමුණුගත කාර්යයන් ඉටු නොකර. විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

(අ) පෞද්ගලික හේතූන් මත සිසුන් කිහිපදෙනෙක් පාඨමාලාව හැර යති. නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ සිසුන් දිවයිනෙන් බැහැරව පුහුණුව සහ රැකියාවල නිරත වී සිටීම නිසා ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයට සහභාගීවීම වසර කිහිපයක් වෙනස් විය හැකිය.

ශිෂ්‍යයින් පලවන වසර සහ දෙවන වසර අවසානයේ පවත්වන විභාගවල දී යම් විෂයන් සංඛ්‍යාවක් අසමත් වූ විට එම විභාගය අසමත් ලෙස සලකනු ලබයි. සමහර සිසුන් බාහිර පුහුණුව අවසානයේදී කරන පරීක්ෂණයෙන් අසමත් වෙති. පලවන වසර දෙවන වසර විභාග සහ බාහිර පුහුණුව සාර්ථකව නිමකරන සිසුන් පමණක් ඩිප්ලෝමා ලබා ගැනීමට සුදුසුකම් ලබති.

(ආ) තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේ ආරම්භ කළ අවස්ථාවේදී මොරටුව විශ්වවිද්‍යාලය සමග ඇතිකරගත් එකඟතාවයට අනුව එවකට බඳවාගත් 350 ක්වූ ශිෂ්‍ය සංඛ්‍යාව එලෙසම පවත්වාගෙන යැමට ආයතනයට සිදුවී ඇති අතර ආයතනය දියගම පරිශ්‍රයේ ස්ථාපනය කිරීමෙන් පසු බඳවාගන්නා සිසුන් සංඛ්‍යාව 1000 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (DEMP) ඉල්ලීම පරිදි පටන්ගත් වැඩසටහනක් ලෙස ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමුවන වසරේ බොහෝ විෂයයන් NODES ජාලයට එක් කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබිණි. (DEMP) ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර තිබුණු බැවින් පිළියෙල කරනු ලැබූ පාඩම් පිළිබඳ දත්ත ලබාගැනීමේ අපහසුතාවයක් මතු වූ නිසා අදාල ගෙවීම් ප්‍රමාද වී තිබිණි. NODES ජාලය හරහා දැන් ලබාගතහැකි එම තොරතුරු ලබාගෙන නියමිත ගණනය කිරීම් කල පසුව ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති මුදලින් අදාල ගෙවීම් සිදු කිරීමට කටයුතු යොදනු ලැබේ.

**විගනන මතය**

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

නියමිත දිනට සේවක භාරකාර අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය නොකිරිම හේතුවෙන් රු. 15,167 ක අධිභාරයක් ගෙවීම් කර තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යමණ්ඩලය හා අනෙකුත් කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

<u>(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

| | අනුමත කථිකාචාර්යවරු සංඛ්‍යාව | සත්‍ය කථිකාචාර්යවරු සංඛ්‍යාව | පුරප්පාඩු කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) කථිකාචාර්යවරු | 27 | 19 | 08 |
| (ii) ආධුනික කථිකාචාර්යවරු | 17 | 12 | 05 |

<u>(ආ) අනෙකුත් කාර්ය මණ්ඩලය</u>

| | | | |
|---|---|---|---|
| (i) මාණ්ඩලික | 04 | 02 | 02 |
| (ii) මාණ්ඩලික නොවන | 29 | 14 | 15 |

**පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග**

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

2000 අගෝස්තු මස 01 දින ස්ථාපනය කරන ලද තාක්ෂණික ආයතනයට සේවා නියුක්තිකයන්ගේ අරමුදල් යැවීම සඳහා අංකයක් ලබා ගැනීම වෙනුවෙන් 2001-01-02 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ, නීති හා උපදෙස් වෙත ලිපියක් මඟින් ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් නිතර නිතර එම මණ්ඩලයෙන් ඒ පිළිබඳව විමසීම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම මණ්ඩලයේ මුල්‍ය කළමනාකරු (අදායම්)ගේ 2004-07-30 දින ලිපිය මඟින් තාක්ෂණික ආයතනය වෙත පී එෆ් 2073 අංකය ලබා දී ඇත. 2000 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 2004-07-30 දක්වා මෙම ආයතනයෙන් සේවක භාර අරමුදල් ගෙවීම් කර ඇත්තේ මොරටුව විශ්වවිද්‍යාලයට ලබාගෙන තිබූ බී 10850 දරණ අංකයට වන අතර යම් යම් හේතූන් මත මෙම ආයතනයේ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් නියමිත දිනයට එම ආයතනයට ප්‍රේෂණය කිරීමට අපහසුතා ඇතිවීම නිසා මෙම ආයතනයට අධිභාරයක් පනවා ඇතත් ඒ සඳහා මෙම ආයතනය පමණක් වගකීම භාරගත යුතු නොවන බව මා විසින් අදහස් කරමි. එහෙත් ආයතනයේ අධ්‍යක්ෂ අරමුදලින් රු. 15,167.52 ක මුදලක් ගෙවා මෙම අධිභාරය නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ), (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

තාක්ෂණික ආයතනය වසර 2000 සිට මොරටුව විශ්වවිද්‍යාලය සමඟ සම්පත් බෙදාගනිමින් වසරකට ශිෂ්‍යයන් 1050 ක ප්‍රමාණයක වැඩකටයුතු පරිපාලනය කරනු ලබයි. පසුගිය වසර කිහිපයේ සිට මොරටුව විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා සිසුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවීම හේතුවෙන් තාක්ෂණික ආයතනයට ලබාදී තිබූ ඉඩකඩ ප්‍රමාණයද ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.එවැනි පසුබිමක අධ්‍යයන හෝ අනෙකුත් කායයී මණ්ඩල පුරප්පාඩු පිරවීමේදී බඳවාගන්නා කායයී මණ්ඩලයට ප්‍රායෝගිකව ලබාදිය හැකි ඉඩකඩ හා පහසුකම් පිළිබඳව ප්‍රශ්ණයක් පැනනගින නිසා එම පුරප්පාඩු පිරවීම දිගින් දිගටම ආයතනයට ගැටළුවක් වී තිබේ.

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** | **5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** |
| **5.1 ක්‍රියාකාරි සැලැස්ම** | **5.1 ක්‍රියාකාරි සැලැස්ම** |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වසර 2011 සිට වසර 2015 කාලය දක්වා සංයුක්ත සැලැස්මක් තාක්ෂණික ආයතනය විසින් පිළියෙල කර ඇත. |
| **5.2 අයවැය පාලනය** | **5.2 අයවැය පාලනය** |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 7 සිට සියයට 72 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | (අ)(ආ) ආයතනයේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කර අයවැයගත ඇස්තමේන්තු 2012 වසරේ සැප්තැම්බර් මස සංශෝධනය කර ඇති අතර උක්ත වියදම් වල ඇස්තමේන්තු ගත වියදම් වලට වඩා සත්‍ය වියදම් ඉහලයාමක් සිදුවී නොමැත. |
| **5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම** | **5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම** |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2010 සහ 2011 වර්ෂවල වාර්ෂික වාර්තා 2013 අගෝස්තු 19 වනවිට සභාගත කර තිබුණි. | වසර 2010 සහ 2011 සඳහා වාර්ෂික වාර්තා මේ වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. 2012 විගණන වාර්තාවේ මතය 2014 ජනවාරි මස ලැබි ඇති බැවින් එයද හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ඇත. |
| **6 පද්ධති හා පාලන** | **6 පද්ධති හා පාලන** |
| විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.<br>(අ) ගිණුම්කරණය<br>(ආ) උපයෝගි ලේඛණය<br>(ඇ) ණය අයකිරීම<br>(ඈ) ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්<br>(ඉ) මුදල් සහ බැංකු පාලනය<br>(ඊ) පර්යේෂණ දීමනා පාලනය<br>(උ) අභ්‍යන්තර විගණනය<br>(ඌ) අයවැය පාලනය | පද්ධති හා පාලන අඩුපාඩු කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම කළමනාකරණ පාලකයන් හැකිතාක් දුරට ඵලදායි කළමනාකරණ පාලක ලෙස උපයෝගී කර ගැනීමට ක්‍රමවේදයක් පිළිබඳව අවධානය යොමු කරන බව සඳහන් කරනු කැමැත්තෙමි. |

**එම්.එම්.පී.ඩී සමරසේකර මිය**
**අධ්‍යක්ෂක, තාක්ෂණික ආයතනය /මොරටුව විශ්වවිද්‍යාලය.**